# වාර්ෂික වාර්තාව 2018

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ

ජාතික අධිකාරිය

428/11ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
දුරකථන: +94112879539 ෆැක්ස්: +94112879540
ඊ - මේල්: witness.protection.srilanka@gmail.com

# පටුන


| | |
|---|---|
| සභාපතිතුමාගේ පණිවුඩය | 03 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | 04 |
| දැක්ම සහ මෙහෙවර | 05 |
| විධායක සාරාංශය | 6-7 |
| හැඳින්වීම | 8-9 |
| අරමුණු | 10 |
| වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් | 11-12 |
| අධිකාරියේ කාර්ය හා කර්තව්‍යයන් | 13-14 |
| අධිකාරියේ බලතල හා කාර්යභාරය | 15 |
| පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය | 16 |
| කළමනාකරණ මණ්ඩලය - 2018 | 17 |
| කාර්ය මණ්ඩලය - 2018 | 18-21 |
| ✓ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | |
| ✓ සහාය කාර්ය මණ්ඩලය | |
| • කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | |
| • රියදුරු | |
| • කාර්යාල කාර්ය සහායක | |
| • කාර්ය මණ්ඩල සාරාංශය | |
| කාර්ය සාධන වාර්තාව | 22-27 |
| ප්‍රතිපත්තිමය සහ නීතිමය ප්‍රතිසංස්කරණ | 28 |
| මූල්‍ය ප්‍රගතිය (අවසාන ගිණුම්) | 29-46 |
| විගණන වාර්තාව | |



## සභාපතිතුමාගේ පණිවුඩය

එවකට ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය මූලික වශයෙන් දඬුවම් දීම අරමුණු කොටගෙන සකස් වූවක් වන අතර, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහන සැලසීම සහ ඔවුන් යථාවත් කිරීම කෙරෙහි ප්‍රමාණවත් සැලකිල්ලක් නොදක්වන ලදී. එබැවින් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයට සහභාගී වීමේදී විශාල දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවිය. අධිකරණ සහ අදාළ අනෙකුත් යාන්ත්‍රණ තුළ ද්විතීක වින්දිතභාවයට පත්වීම, අපරාධකරුවන්ගෙන් සිදුවන පීඩා, බලපෑම්, තර්ජනය කිරීම් හේතුවෙන් අපරාධයක යුක්කිය පසිඳලීමේ යාන්ත්‍රණය කෙරෙහි විශ්වාසයක් ඔවුන්හට නොතිබිණි. මෙකී කරුණු මත අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක අවශ්‍යතාවය කෙරෙහි 2005 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ අවධානය යොමු විය. මේ සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් ද අවධානයක් යොමුවී තිබීම තවත් සුවිශේෂී කරුණක් විය. ඒ අනුව 2005 වර්ෂයේ දී අපරාධයක වින්දිතයන් හට සහය සැලසීම සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම වශයෙන් නව නෛතික මූලධර්ම ද්විත්වයක් සකස් කිරීම ආරම්භ කර ලද අතර අපරාධයක වින්දිතයන් පිළිබඳ ජාතික මධ්‍යස්ථානය සහ ජාතික නීති කොමිසම මෙයට මුල්වී කටයුතු කරන ලදී. මෙම නව නීතිය සකස් කිරිමේ දී නීතිපති දෙපාර්තමේන්තුවෙන් දක්වන ලද දායකත්වය ද විශේෂයෙන් සිහිපත් කිරීමට කැමැත්තෙමි. මෙකී සියලු කර්තව්‍යයන් හි ප්‍රතිඵලයක් වශයෙන් 2015 මාර්තු මස 13 වන දින 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත පාර්ලිමේන්තුවේ ඒකමතිකව සම්මත වීම ශ්‍රී ලංකා නීති ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් බව ප්‍රකාශ කරනුයේ ඉමහත් සන්තෝෂයෙනි. මෙම නව නීතිය ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ පවතින අපරාධ යුක්කිය  පැවති විශාල හිඩැසක් පිරවීමක් බව මාගේ විශ්වාසයයි.2016 ජනවාරි මස 08 වන දින අප ආයතනය එවකට ජනාධිපතිතුමා විසින් උත්සවාකාරයෙන් ආරම්භ කරන ලද අතර, 2016 මැයි මස 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි අධිකරණ ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස අතිවිශේෂ ගැසට් අංක 1967/8 මඟින් ස්ථාපනය කරන ලදී. මූලික අවධියේ දී එනම් 2016 සහ 2017 වර්ෂයන් තුළදී නව්‍ය ආයතනයක් ලෙස පිහිටවූ විට මුහුණ දෙනු ලබන විවධ දුෂ්කරතා හේතුවෙන් පසු බෑමක් ඇති වුවද 2018 වර්ෂයේ අපගේ සේවාවන් කාර්යක්ෂමව සහ ඵලදායීව යෙදවීමට අඩිතාලම සකසා ගැනීමට හැකිවීම අප ලද භාග්‍යයක් කොට සලකමි.

මෙම නව පනතේ කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය සහ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය මේ වන විට ඉතාමත් සක්‍රියව කටයුතු කරනු ලබයි. මෙම නව නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් දීප ව්‍යාපත්ව සිදු කිරීමට සහ ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් ලබාදෙන ලද මූල්‍යාමය දායකත්වය ඉතා අගය කොට සලකමි. එලෙසම අප ආයතනයේ ව්‍යුහාත්මක වටපිටාව සකස් කිරීම මෙන්ම පවත්වාගෙන යාමට ඉවහල්වන රාජ්‍ය දායකත්වය සිහිපත් කරන්නේ ඉතා සතුටිනි.
අපගේ ආයතනය අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා පූර්ණ වශයෙන් දායක වන දකුණු නැගෙනහිර ආසියාවේ පවතින එකම ආයතනය වීම මෙන්ම අන්තර්ජාතිකව අපට ලැබී තිබෙන කීර්තිය ද අප ලද සුවිශේෂී ජයග්‍රහණයක් බව ඉමහත් සන්තෝෂයෙන් ප්‍රකාශ කරන අතර, එය අපරාධයක වින්දිතයන්  සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම වෙනුවෙන් දකුණු ආසියාවේ පවතින හොඳම ආයතනය බවට පත්කිරීම මාගේ ඒකායන අරමුණයි.
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරකින ශ්‍රී ලංකාවක් බිහිකරනු වස් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය යන ගමන් මඟ තුළ පෙළගැසී සිටින කළමනාකරණ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ආයතනික කාර්යය මණ්ඩලය ඉතා ගෞරවයෙන් සිහිපත් කරන අතරම 2018 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය ගෙන ඒමට ලැබීම ඉමහත් සතුටකි.

සුහද කේ. ගමලත්
සභාපති



# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව සඳහා මෙම කෙටි පණිවිඩය මා ගෙන එන්නේ ඉමහත් සතුටිනි. 2018 වර්ෂයේදී අධිකාරියේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සිහිගැන්වීම සඳහා මෙය විශේෂ අවස්ථාවක් කර ගනිමි.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය 2016 ජනවාරි මස 8 වන දින ආරම්භ කිරීමෙන් අනතුරුව ගතවූ වසර තුනක කෙටි කාලය තුළදී සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති බව කිව යුතුය. 2018 වර්ෂය ඒ අතුරින් සුවිශේෂී වේ. 2018 වර්ෂය වන විට අධිකාරියේ කාර්යමණ්ඩල සාමාජිකයන් ගණන 31 දක්වා වැඩි කර ගැනීමට හැකි වූ අතර අධ්‍යක්ෂ (මූල්‍ය), සහකාර අධ්‍යක්ෂ (පාලන) සහ රියදුරු තනතුරු 03ක් මෙම වර්ෂය තුලදී බඳවා ගන්නා ලදී. මීට සමගාමීව ආයතනයේ කාර්ය මණ්ඩලය නිපුණතා සංවර්ධනය උදෙසා අදාල ක්ෂේත්‍රන්හි නිපුණතා සංවර්ධන වැඩසටහන් සඳහා යොමු කිරීමට හැකි වීමද ආයතනයේ සාර්ථකත්වයට හේතු වී ඇත.

2016 සහ 2017 වර්ෂවල අධිකාරියට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව පිළිවෙලින් 14ක් සහ 49ක් වූ අතර 2018 වර්ෂය තුලදී පැමිණිලි සංඛ්‍යාව 86ක් දක්වා වර්ධනය වී ඇත. මෙය 2017 වර්ෂය සමග සංසන්දනය කිරීමේදී 76%ක වැඩිවීමකි. පැමිණිලි සම්බන්ධ විමර්ශන කටයුතු කඩිනමින් සිදු කිරීම සහ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වන නව නීතිය සම්බන්ධයෙන් දිවයින පුරා සිදුකරන ලද දැනුවත් කිරීම් මීට හේතු වූ බව ප්‍රකාශ කරනුයේ ඉමහත් සංතෝෂයෙනි.

2018 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල මගින් (UNDP) අධිකාරිය සමග ගිවිසුම් ගතව සිදුකරන ලද රුපියල් මිලියන හතළිහක (40)ක ප්‍රදානයද මෙහිදී විශෙෂයෙන් සිහිපත් කළ යුතුය. එකී මුදල් යොදා ගනිමින් දිවයිනේ සියළුම පොලිස් ස්ථානාධිපතිවරුන් , අධිකරණ වෛද්‍ය නිලධාරින්, නීති ආධාර කොමිසමේ නීති නිලධාරින් සහ බන්ධනාගාර නිලධාරින් ආවරණය වන පරිදි වැඩමුළු 14ක් 2018 වර්ෂය තුල පවත්වා ඇත. එමෙන්ම අධිකාරියේ කාර්යාල පරිශ්‍රය වැඩි දියුණු කර ගැනීම, අධිකාරියට අවශ්‍ය තොරතුරු තාක්ෂණික මෙවලම් මිලදී ගැනීම, මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය මෙවලම් මිලදී ගැනීම, ආයතනයේ පුස්තකාල සහ පර්යේෂණ ස්ථානය සඳහා පොත් පත් මිලදී ගැනිම ඇතුළු ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම සඳහා එකී ප්‍රදානය යොදා ගැනීමට හැකිවීමද අධිකාරිය ලද සුවිශේෂී ජයග්‍රහණයකි. තවද විදේශ කටයුතු අමාත්‍යාංශය, නීති ආධාර කොමිසම (Legal Aid Commission), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (United Nations Children's Fund), ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය (Transparency International), ආසියානු වින්දිත සහයෝගීත්ව ජාලය (Victim Support Asia) වැනි දේශීය සහ ජාත්‍යන්තර ආයතන සමග එක්ව කටයුතු කිරීම මගින් අධිකාරියට සිය අභිමතාර්ථ ඉටු කර ගැනීමට හැකි වීමද අගය කොට සලකමි.

අපරාධ වලට ලක්වූවන් සහ සාක්ෂිකරුවන් හට නොබියව සිය අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් නීතියේ ආධිපත්‍ය තහවුරු වන පරිදි සමාජ වගකීම ඉටු කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂාව සහ සහාය ලබා දීම මගින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සාධනීය ගුණාංග ප්‍රවර්ධනය අධිකාරියේ අපේක්ෂාව වන අතර ඒ සඳහා උපරිම දායකත්වය දැක්වීමට අනාගතයේදීද අප කැප වන බව මෙහිලා විශේෂයෙන් සඳහන් කරමු.

උදයකුමාර අමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

✓ <u>දැක්ම</u>

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරකින ශ්‍රී ලංකාවක්**

✓ <u>මෙහෙවර</u>

**අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම, බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම**

# විධායක සාරාංශය

2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලගන්වමින් 2016 සිට අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 428/11ඒ දරන ස්ථානයෙහි පළමු මහලෙහි ස්ථාපිත කර ඇත. අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය, නිල බලයෙන් පත්වන සාමාජිකයන් හත් (7) දෙනෙකුගෙන්ද ජනාධිපතිවරයා විසින් තෝරා පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් ද සමන්විත වේ. අතිගරු ජනාධිපතිතුමා විසින් අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබූ විශ්‍රාමික සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ සුහද කේ ගමලත් මහතා කටයුතු කරන ලදී.

අධිකාරියට අනුමත 54ක කාර්යය මණ්ඩලයෙන් 2017 වන විට නිලධාරීන් 26 දෙනෙකු බඳවා ගෙන සිටි අතර, 2018 වන විට එය 31 දක්වා වැඩිකර ගත් අතර එහිදී අධ්‍යක්ෂ (මූල්‍ය), සහකාර අධ්‍යක්ෂ (පාලන) සහ රියදුරු තනතුරු 3ක් ද බඳවා ගනු ලැබීය. එයට සමගාමීව ආයතනයේ කාර්ය මණ්ඩලයේ නිපුණතා වර්ධනය උදෙසා අදාළ ක්ෂේත්‍රයන්හි නිපුණතා සංවර්ධන වැඩමුළු සඳහා යොමු කරන ලදි, විශේෂයෙන්ම, අධිකරණ අමාත්‍යාංශයට ඇතුලත් වූ නවතම ආයතනය ලෙස ආයතනයේ විවිධ අංශයන්හි එදිනෙදා වැඩ කටයුතු කරගෙන යාමට අවශ්‍ය විෂයන් පිළිබඳ දැනීම මෙන්ම අධිකාරියේ මෙම විෂය පථයට අදාළ දකුණු ආසියාවේ පිහිටවන ලද ප්‍රථම ආයතනය වශයෙන් තාක්ෂණික විෂයන් පිළිබඳව හා දේශීය සහ ජාත්‍යන්තර ක්‍රමවේද පිළිබඳව දැනුවත් වීම අවශ්‍ය වන බැවින් මෙම වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් සහභාගී විය.

තවද අප ආයතනයේ පවතින ඉඩකඩ ප්‍රමාණය කළමනාකරණය කර ගනිමින් සියළුම බඳවා ගත් නිලධාරින් මෙන්ම ඒ වනවිටත් කාර්යයේ නියුතු නිලධාරීන් හට කාර්යාල ඉඩකඩ පහසුකම් සලසා දී ඔවුන්ගේ කාර්යයන් පහසුවෙන් කිරිමට අවශ්‍ය කාර්යාල උපකරණ මෙන්ම ඉඩකඩ බෙදා වෙන් කරන ලදී.

2018 වසරේ කළමනාකරණ මණ්ඩල රැස්වීම් 24ක්ද, විශේෂ කළමනාකරණ මණ්ඩල රැස්වීම් 01ක් ද විධායක අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් 06ක් ද , විගණන කමිටු රැස්වීම් වාර 02ක් ද පැවැත්විණි.

2018 වර්ෂය තුළ අප ආයතනයට ලැබුණු පැමිණිලි ගණන 86ක් වන අතර, එය 2017 වසර සමඟ සංසන්දනාත්මකව බලන කල එය 76%ක වර්ධනයකි. 2018 වසරේ ලැබුණු පැමිණිලි වලින් අවසන් කරන ලද පැමිණිලි ගණන 24ක් වේ. එමෙන්ම එම කාලය තුළ ආරක්ෂාව සැලසූ පැමිණිලි ගණන 5ක් වන අතර වෙනත් ආයතන වලට යොමු කරන ලද පැමිණිලි ගණන 11කි. විමර්ශන වෙමින් පවතින පැමිණිලි ගණන 38ක් වන අතර බහාලන ලද පැමිණිලි ගණන 03කි.

2018 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) සමඟ ගිවිසුම් ගත රුපියල් මිලියන 40ක ප්‍රදානයෙන් ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ප්‍රධාන වශයෙන්ම දිවයිනේ සියළුම පොලිස් ස්ථානාධිපතිවරුන්, අධිකරණ වෛද්‍ය නිලධාරීන්, නීති ආධාර කොමිෂමේ නීති නිලධාරීන් සහ බන්ධනාගාර කොමසාරිස්වරුන් සහ අධිකාරිවරුන් දැනුවත් කිරීමේ සහ සංවේදී කිරීමේ වැඩසටහන් 2018 වසරේදී සිදු කළ අතර එම පාර්ශවයන් සමඟ වැඩමුළු 14ක් පමණ පවත්වන ලදී. විශේෂයෙන්ම දිවයින පුරා ඇති පොලිස් ස්ථාන 492 ආවරණය වන පරිදි පළාත් මට්ටමෙන් සියළුම පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් සහ සංවේදීකරණය කිරීමට හැකිවිය. එමඟින් අප ආයතනයට අදාළවූ නීතිය සවිබල ගැන්වීමේ ක්‍රියාවලියට ඍජුවම දායක වන පාර්ශවයන් සඳහා විශේෂිත වූ දේශන මාලා රාශියක් අප ආයතනයේම කළමනාකරණ මණ්ඩලයේ විද්වතුන් විසින් ඔවුන්ට ලබාදෙන ලදී. මෙම සියළු වැඩසටහන් වලදී අප

අධිකාරියේ තාක්ෂණික ක්‍රියාවලියට අදාළ අත් පත්‍රිකා සහ සරල සංක්ෂිප්ත පත්‍රිකා සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් (Transparency International) ආයතනයෙන් ලබා දුන් අත්පොත් බෙදා දෙන ලදී.

තවද 2018 වර්ෂයෙදී විදේශ කටයුතු අමාත්‍යාංශය, නීති ආධාර කොමිසම (Legal Aid Commission), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (United Nations Development Programme), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (United Nations Children’s Fund), ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් (Transparency International) ආයතනය, ආසියානු වින්දිත සහයෝගිත්ව (Victim Support Asia) ජාලය වැනි ජාත්‍යන්තර සහ දේශීය ආයතන සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමට හැකිවිය. තවද අධිකරණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබූ ආධාර ලබා ගැනීම සඳහා වූ සමුළුවේදී (Dorner Forum ) අධිකාරියේ යෝජනා ඉදිරිපත් කරන ලදී.

ඒවගේම වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහාය සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස්වරුන් හා අධිකාරියේ සහ පොලිස් ආරක්ෂක කොට්ඨාසයේ ඉහළ නිලධාරීන් මෙම පනතට අදාළව ඉදිරි වැඩපිළිවෙල පිළිබඳව විශේෂ වැඩමුළුවක් පැවැත්වීය. එහිදී වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ හිමිකම් සහ අයිතිවාසිකම් පිළිබඳව මෙන්ම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහ අප ආයතනය අතර අන්තර් සම්බන්ධතාවය තහවුරු වන කරුණු කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්වීය.

අප අධිකාරියට අවශ්‍ය තොරතුරු තාක්ෂණික මෙවලම් එනම් ලැප්ටොප් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ෆොටෝකොපි යන්ත්‍ර, කැමරා ඇතුළු ආයතනික වශයෙන් වැදගත් වන උපකරණ රාශියක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ආධාර මඟින් 2018 වසරේ දී ලබා ගැනීමට හැකිවිය.

අප ආයතනය ආරම්භ කොට මූලික අවධියේ පවතින බැවින් මහජනයා දැනුවත් කිරීමට අදාළ දනුවත් කිරීමේ වැඩසටහන් සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය හා දෘශ්‍ය මෙවලම්, පෝස්ටර් සහ අත්පත්‍රිකා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ ප්‍රතිපාදන මත නිපදවිය. මෙහිදි ආයතනයේ ඉහළ නිලධාරීන්ගේ සහාය සහ UNDP ආයතනයේ මූල්‍යමය දායකත්වයට අමතරව තාක්ෂණික සහාය ද හිමිවිය.

එමෙන්ම UNDP ප්‍රදානය යටතේ ආයනයේ පුස්තකාල සහ පර්යේෂණ ස්ථානය සඳහා පොත් පත් ගැනීමට මූලික පියවර ගනු ලැබීය.

2018 වසරේ මූල්‍ය ප්‍රගතිය ලෙස රජයේ පුනරාවර්තන වියදම් 90% ද රජයේ ප්‍රාග්ධන වියදම් 61% ද සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල මඟින් ලබා දුන් ප්‍රදානයේ වියදම් 86% වශයෙන් ද ළඟා කර ගන්නා ලදී.

# හැඳින්වීම

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 428/11ඒ දරන ස්ථානයෙහි පළමු මහලෙහි වර්ග අඩි 2800ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්ත ගොඩනැගිල්ලක් තුල මෙම ආයතනය පිහිටුවා ඇති අතර, අතිගරු ජනාධිපතිතුමා විසින් 2016.01.08 වන දින අධිකාරිය උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. පසුව අංක 1966/02 හා 2016.05.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මඟින් උක්ත අධිකාරිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(2) ව්‍යවස්ථාව යටතේ 2016.04.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු අධිකරණ අමාත්‍යවරයා යටතට පවරා ඇත. ඒ අනුව අධිකරණ අමාත්‍යවරයා විසින් අංක 1967/08 හා 2016.05.16 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මඟින් 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීම පනතෙහි සියලු කොටස් 2016.05.18 දින සිට ක්‍රියාත්මක කොට ඇත.

පනතෙහි 12(ආ) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් 2016.08.11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය පත්කර ඇති අතර එය අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, පොලිස් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්, කාන්තා කටයුතු විෂය හා ළමා කටයුතු විෂය භාර අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශවල ලේකම්වරු හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් හා මානව හිමිකම් කොමිෂන් සභාවේ සමාජිකයකු, නීතිපතිවරයාගේ නියෝජිතයකු සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධූරය දරන පොලිස්පතිවරයාගේ නියෝජිතයකු ඇතුළත්වන නිල බලයෙන් පත්වන සාමාජිකයන් හත් (7) දෙනකුගෙන්ද අපරාධවේදය, අපරාධ යුක්ති පද්ධතිය, මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම හෝ වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත හෝ ඒ හා සම්බන්ධිත වෘත්තීන්හි අධ්‍යාපනික හෝ වෘත්තිමය සුදුසුකම් ලත් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතරින් ජනාධිපතිවරයා විසින් තෝරා පත් කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් ද සමන්විත වේ. අතිගරු ජනාධිපතිතුමා විසින්, මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු වන සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ සුහද කේ. ගමලත් මහතා 2016 අගෝස්තු මස 11 වන දින සිට අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී.

## අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ පනතෙහි අරමුණු පහත පරිදි වේ.

(පනතෙහි (2) වගන්තිය)

1. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම, ස්ථිර කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක් සැලසීම.
2. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව ලබාදීම.

3. අපරාධයක වින්දිතයන්ට එරෙහිව වරදක් සිදුකිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගෙන් වින්දිතයන් හට වන්දි මුදල් ලබාගැනීමට සැලැස්වීම.

4. ප්‍රතිෂ්ඨාපනය, වන්දි, හානිපූරණය සහ පුනරුත්ථාපනය ඇතුළුව , අපරාධයක වින්දිතයන් හට සහන ලබාගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම.

5. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් වර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම උදෙසා වූ, රජයේ අධිකරණ නිලධරයන්ගේ සහ රජයේ නිලධරයන්ගේ කාර්යය සහ වගකීම දැක්වීම.

6. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුකළ හැකි වැරදි සඳහන් කිරීම සහ ඒ වැරදි සිදු කරන තැනැත්තන් උදෙසා පැනවිය හැකි දණ්ඩන නියම කිරීම.

7. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට අදාළව යහපත් ප්‍රතිපත්ති පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

## අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම්

**අපරාධයක වින්දිතයකු සතු අයිතිවාසිකම් (පනතෙහි (3)වගන්තිය)**

1. සමාන ව සාධාරණ ව වින්දිතයාගේ ගරුත්වයට සහ පෞද්ගලිකත්වයට සලකවාගනු ලැබීමට (3 (1) (අ) වගන්තිය)
2. ළමා වින්දිතයෙකු වන විටෙක ඔහුගේ උපරිම යහපත තහවුරු වන ලෙස සලකවාගනු ලැබීමට (3 (1) (ආ) වගන්තිය)
3. වින්දිතයකු වීම නිසා යම් අලාභයක් සිදු වුණි නම්, ඒ සඳහා අප්‍රමාද ව සුදුසු සහනයක් ලබා ගැනීමට(3 (1) (ඇ) වගන්තිය)
4. මානසික හෝ කායික හිංසාවක් සිදු වුණි නම් ඒ සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට (3 (1) (ඉ) වගන්තිය)
5. තර්ජන හා බියගැන්වීම්වලින් නිසි ආකාරයෙන් ආරක්ෂා වීමට (3 (1) (ඈ) වගන්තිය)
6. වින්දිතයා ඉල්ලීමක් කර ඇති විටදී, අධිකාරිය මගින් හෝ කොට්ඨාසය මගින් නීතිමය තත්වයන් පිළිබඳව දැනුවත් වීමට, පැමිණිල්ලේ විමර්ශනය පිළිබඳ දැනුවත් වීමට, අධිකරණ කටයුතුවල ප්‍රගතිය පිළිබඳව දැනුවත් වීමට අවශ්‍ය වෛද්‍ය, සමාජ සේවා සහ අනෙකුත් සේවාවන් පිළිබඳව දැනුවත් වීමට(3 (1) (ඊ) වගන්තිය)
7. පොලිස් නිලධාරියෙකු ලවා පැමිණිල්ලක් වාර්තාගත කර ගැනීමට සහ එම පැමිණිල්ල පූර්ණ ලෙස විමර්ශනය කරවා ගැනීමට(3 (1) (උ) වගන්තිය)
8. වරදකට අදාළ ව විවිධ විමර්ශනයන් සිදු කෙරෙන කාලසීමාවේදී අදාළ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියෙකු වෙතට නීතිඥයෙකු මගින් පෙනී සිට කරුණු ඉදිරිපත් කිරීමට (3 (1) (ඌ) වගන්තිය)
9. පොලීසිය මගින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගොනු කළ යුතු වාර්තාවල සහතික පිටපත් ලබා ගැනීමට(3 (1) (එ) වගන්තිය)
10. වින්දිතයාට එරෙහි ව කර ඇති වරදකට අදාළ ව නඩු කටයුත්තක් පවත්වා ගෙන යාමට පෙර සහ එය පවත්වා ගෙන යන කාලසීමාව තුළ නීතිපතිවරයා වෙත කරුණු ඉදිරිපත් කිරීම පිණිස නීතිඥයෙකු මාර්ගයෙන් ලිපි යැවීමට හෝ නියෝජනයන් සිදු කිරීමට (3 (1) (ඒ) වගන්තිය)

11. අදාළ වරද සම්බන්ධයෙන් විමර්ශන පවත්වන විමර්ශකයෙකු වෙත ලිපි යැවීමට හෝ නියෝජනයන් සිදු කිරීමට සහ එම නියෝජනයන්ට ප්‍රතිචාරයන් ලබා ගැනීමට (3 (1) (ඔ) වගන්තිය)
12. වරද සිදු කරනු ලැබූ තැනැත්තා වරදකරු කිරීමෙන් පසු එය දඬුවම තීරණය කිරීමට පෙර, එම වරද වින්දිතයාගේ ජීවිතයට බලපෑ ආකාරය පිළිබඳව පුද්ගලිකව හෝ නීතිඥයෙකු මාර්ගයෙන් අධිකරණයට දැන්වීමට (3 (1) (ඕ) වගන්තිය)
13. වරදකරු අභියාචනයක් හෝ ප්‍රතිශෝධනයක් ඉදිරිපත් කර තිබෙන විට එම වරද වින්දිතයාගේ ජීවිතයට බලපෑ ආකාරය පිළිබඳ ව පුද්ගලික ව හෝ නීතිඥයෙකු මාර්ගයෙන් අධිකරණයට කරුණු දැන්වීමට (3 (1) (ජ) වගන්තිය)
14. වරද සිදු කරනු ලැබූ තැනැත්තාට සමාවක් දීම සලකා බැලීමක දී හෝ දඬුවමක් ලිහිල් කිරීම සලකා බැලීමක දී ඒ පිළිබඳව දැන්වීමක් ලැබීමට සහ එම වරද වින්දිතයාගේ ජීවිතයට බල පෑ ආකාරය පිළිබඳ ව පුද්ගලිකව හෝ නිතිඥයෙකු මාර්ගයෙන් හෝ අදාළ අධිකාරියට දැන්වීමට (3 (1) (ට) වගන්තිය)

**අපරාධයක වින්දිතයකු සතු හිමිකම් (පනතෙහි (4) වගන්තිය)**

1. යම්කිසි අධිකරණ කටයුත්තකට සහභාගි වීම නිසා, අපරාධයක වින්දිතයකුට දරන්නට සිදු වූ වියදම් වෙනුවෙන් අධිකාරියෙන් කිසියම් මුදලක් ලබා ගැනීමට(4 (1) වගන්තිය)
2. අපරාධයක වින්දිතයකු වීම නිසා අත්විඳි කායික හෝ මානසික හිංසාවන් සඳහා සුදුසු වෛද්‍ය ප්‍රතිකාර, උපදේශන සේවා රජයෙන් ඉල්ලා සිටීම (4 (2) වගන්තිය)
3. රජයට වෛද්‍ය ප්‍රතාකාර හෝ උපදේශන සේවා ලබා නොදිය හැකි අවස්ථාවක දී එකී අවශ්‍යතා පෞද්ගලික අංශයෙන් ලබා ගැනීම සඳහා අධිකාරියට ඉල්ලීමක් කිරීමට (4 (3) වගන්තිය)

**සාක්ෂිකරුවෙකු සතු හිමිකම් (පනතෙහි (5) වගන්තිය)**

1. සාක්ෂිකරුවන්ගේ ගෞරවයට සහ පුද්ගලිකත්වයට සාධාරණයක් වන සේ සහ ගෞරවයෙන් සලකවා ගනු ලැබීමට(5 (1) වගන්තිය)
2. මූලික අයිතිවාසිකමක් කඩ කිරීමටකට අදාළ ව තොරතුරු සැපයීම, යම් වරදක් පිළිබඳ ව විමර්ශනයක් පවත්වන අතරතුරදී ස්වේච්ඡාවෙන් ප්‍රකාශනයක් කිරීම හෝ යම්කිසි වරදක් සිදු කිරීමකට හෝ මූලික අයිතිවාසිකම් කඩ කිරීමකට අදාළ ව අධිකරණයක දී සාක්ෂි ලබා දීමේ දී සාක්ෂිකරු කිසිදු හිරිහැරයකට ලක් නොවී සිටීමේ හිමිකම. එවැන්නකට එරෙහි ව ආරක්ෂාව ලබා ගැනීමට සාක්ෂිකරුවෙකුට හිමිකමක් ඇත.(5 (1) වගන්තිය)

**තොරතුරු සපයන්නන් සතු හිමිකම් (පනතෙහි (6) වගන්තිය)**

සාක්ෂිකරුවකු වන හෝ නොවන හෝ යම්කිසි පුද්ගලයෙකු තමාගේ සේවා ස්ථානයේ වන වරදක් හෝ මූලික අයිතිවාසිකමක් කඩ කිරීමකට අදාළ ව තොරතුරු සැපයීම, ඒ පිළිබඳ ව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හෝ ඊට අදාළ ව අධිකරණයක දී සාක්ෂි ලබා දීම හේතු කොට ගෙන එකී පුද්ගලයාට කිසිදු හිරිහැරයක් හෝ රැකියාවේ අහිතකර වෙනසකට එරෙහි ව ආරක්ෂාව ලබා ගැනීමට හිමිකමක් ඇත.(6 වන වගන්තිය)

# අධිකාරියේ කාර්යය සහ කර්තව්‍ය

## (පනතෙහි (13) වගන්තිය)

1. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම සහ ඒවාට ගෞරවය කිරීම ප්‍රවර්ධනය කිරීම.
2. සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනා ගැනීම සහ ඒවාට ගෞරව කිරීම ප්‍රවර්ධනය කිරීම.
3. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම හෝ ආරක්ෂා කිරීමට සැලැස්වීම.
4. අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් කඩ කරන ලදැයි යන්න පිළිබඳ ව ලැබුණු පැමිණිල්ලක් හෝ යම් තොරතුරු මත, මේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම උදෙසා, කරන ලදැයි කියන කඩ කිරීම පිළිබඳ ව විමර්ශනය කර ඒ සම්බන්ධයෙන් සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගැනීමට අදාළ අධිකාරීන්ගෙන් ඉල්ලා සිටීම.
5. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට අවශ්‍ය ප්‍රතිකාර, හානිපූරණය, ප්‍රතිෂ්ඨාපනය සහ පුනරුත්ථාපන පියවර ගැනීම ඇතුළු ව අවශ්‍ය සහාය සැපයීම.
6. අපරාධයක වින්දිතයන් හට මේ පනතේ 29 වන වගන්තිය මගින් පිහිටුවන ලද අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
7. මේ පනත මඟින් සලසා ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳ ව මහජනයා දැනුවත් කිරීම.
8. විශේෂයෙන් ම අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට -
   i. ඵලදායී ආරක්ෂාව
   ii. අවශ්‍ය ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ උපදේශනය
   සහ
   iii. වෙනත් සුදුසු සහායයන් සැපයීම ඇතුළු ව,

   අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට මෙම පනතින් සලසා ඇති අයිතිවාසිකම් සහ හිමිකම්වලට බලාත්මක භාවයක් ලබා දීම පිණිස යොදා ගත යුතු, පිළිගත යුතු හෝ ක්‍රියාත්මක කළ යුතු සුදුසු සහ විශේෂිත පියවර පිළිබඳ සාමාන්‍යයෙන් හෝ එක් එක් අවස්ථාවන් වෙන් වෙන් ව සලකා බැලීමේ පදනම මත, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට සහ වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තුවකට, ව්‍යවස්ථාපිත ආයතනයකට සහ රජයේ නිලධරයන්ට, උපදෙස් දීම සහ නිර්දේශ කිරීම.

9. විවිධ අධිකාරීන් විසින් පිළිගත් සහ අනුගමනය කරන, දැනට පවතින ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියාමාර්ග සහ ක්‍රියාපටිපාටි අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට අදාළව පිළිගත් සම්මතයන්ට සහ යහපත් පරිචයන්ට අනුකූල බව තහවුරු කර ගැනීම උදෙසා

ඒවා සමාලෝචනය කිරීම හා එම සමාලෝචනයන් පදනම් කර ගනිමින් සුදුසු ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියා මාර්ග පිළිගැනීම, සංශෝධනය කිරීම සහ යොදා ගැනීම පිළිබඳ ව නිර්දේශ කිරීම.

10. යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් හෝ වෙන යම් තැනැත්තකුගේ ඉල්ලීම මත, සමකාලීන හෝ ආසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි ලබා ගැනීමේ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිබඳ ව තොරතුරු ලබා දීමට සැලැස්වීම.

11. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, භාෂාව, සංස්කෘතික විශ්වාසයන් සහ පුරුදු, ජන වාර්ගික හෝ සමාජ ප්‍රභවයන් හෝ ආබාධිත බව හෝ වෙනත් යම් හේතු නිසා සිදු විය හැකි හානිවල ප්‍රතිඵලයන් ලෙස අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට පැන නගින අවශ්‍යතා සහ සුවිශේෂ කණ්ඩායම්වලට අයත් අපරාධයක වින්දිතයන්ට පැන නගින විශේෂ අවශ්‍යතා මත, ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන්, පරිවාස හා සමාජ සේවාවලට සම්බන්ධ රජයේ නිලධරයන් ඇතුළුව, නීතිය බලාත්මක කිරීමට සම්බන්ධ රජයේ නිලධරයන් සංවේදීකරණය කිරීමට පියවර ගැනීම.

12. ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන් සහ රජයේ සමාජ සේවා ආයතනවල නිලධරයන් ඇතුළු ව, නීතිය බලාත්මක කිරීමට අදාළ අධිකරණ, කොමිෂන් සභා, වෙනත් යම් විනිශ්චය සභා, රජයේ නිලධරයන් සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවා නියුක්තිකයන් විසින්, අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීමට අදාළ පාලන සංග්‍රහයන් සහ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිපැදීම සහ අදාළ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ නිර්දේශ කිරීම.

**පනතේ 11 වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මෙම ජාතික අධිකාරියේ බලතල හා කාර්යභාරය පහත සඳහන් පරිදි සංක්ෂිප්ත ව දැක්විය හැකි ය.**

- **බලාත්මක කිරීමේ කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් හඳුනා ගැනීම, ගෞරව කිරීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම හා දැනුවත් කිරීම.

- **අර්ධ අධිකරණමය කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම හා විභාග කිරීම, එම උල්ලංඝනයට අදාළ ව උචිත රාජ්‍ය නිලධාරීන්ට සහ රාජ්‍ය ආයතනවලට නියෝග නිකුත් කිරීම

- **සේවා කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සහ සහාය සැලසීම, වන්දි ප්‍රදානය කිරීම

- **නියාමන කාර්භාරය**

  නියමු උපදේශන නිකුත් කිරීම හා අධීක්ෂණය, අපරාධ සිදුවීම අඩු කළ හැකි ක්‍රම හා විධි පිළිබඳ ව පර්යේෂණ පැවැත්වීම හා ප්‍රවර්ධනය කිරීම, අපරාධ වැළැක්වීමේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම

# පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය

2015 අංක 4 දරන පනත මගින් පිහිටුවන ලද තවත් එක් සුවිශේෂ ඒකකයක් වන්නේ ජාතික අධිකාරියේ උපදේශනය හා මඟ පෙන්වීම මත ශ්‍රී ලංකා පොලිසිය යටතේ පිහිටුවන ලද ‘‘අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය’’ ලෙස හැඳින්වෙන විශේෂ පොලිස් ඒකකයයි. පනතේ 19 (2) වගන්තිය යටතේ කළමනාකරණ මණ්ඩලයට නිල බලයෙන් පත් කෙරෙන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාකරන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු මෙම කොට්ඨාසය භාර ප්‍රධානියා ලෙස පත් කරනු ලැබ ඇති අතර 2016 නොවැම්බර් මස 03 වන දින සිට මෙහි කටයුතු ආරම්භ කර ඇත.

ජාතික අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන නියමු උපදේශන අනුගමනය කරමින් “කොට්ඨාසය” පවත්වා ගෙන යා යුතු අතර අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීම, ඔවුන්ට හා ඔවුන්ගේ දේපළවලට සිදු කරනු ලබන තර්ජන, හානි පැමිණවීම් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක්, චෝදනාවක් හෝ තොරතුරක් පිළිබඳ ව “කොට්ඨාසය” විසින් ම පොලිස් නිලධරයෙකුගේ සහාය ඇති ව විමර්ශනය කිරීම කොට්ඨාසයේ කාර්ය විය යුතු අතර ඔවුන්ට ආරක්ෂාව සහ සහාය වීම සඳහා අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ මත කාර්යක්ෂම පියවර ගැනීමට විධිවිධාන සැලසීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

# අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය

පනත ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පත් කළ සාමාජිකයින් :-



1. සභාපති : - ජනාධිපති නීතිඥ සුහද කේ.ගමලත් මහතා
   විශ්‍රාමික සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව



2. උදයකුමාර අමරසිංහ මහතා
   අපරාධ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
   ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



3. වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා
   ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී



4. වෛද්‍ය නීල් ප්‍රනාන්දු මහතා
   විශේෂඥ මනෝ වෛද්‍ය නිලධාරී



5. වෛද්‍ය හිරන්ති විජේමාන්න මහත්මිය
   විශේෂඥ වෛද්‍ය නිලධාරී

නිල බලයෙන් පත්වූ සාමාජිකයින්: -

1. යසන්ත කෝදාගොඩ මහතා
   අතිරේක සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව





2. එම්. ආර් ලතීෆ් මහතා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
   පොලිස් මූලස්ථානය



3. නීතිඥ එච්.ජී.හුසේන් මහතා
   කොමසාරිස්
   මානව හිමිකම් කොමිෂන් සභාව



4. නීතිඥ පියුමන්ති පීරිස් මහත්මිය
   අතිරේක ලේකම් (නීති)
   අධිකරණ අමාත්‍යාංශය



5. විජිතා සෙනෙවිරත්න මහත්මිය
   අතිරේක ලේකම්
   නීතිය, සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය



6. පද්මසිරි ජයමාන්න මහතා
   ලේකම්
   නීතිය හා සාමය අමාත්‍යාංශය



7. එල්.ටී.ඩී. පෙරේරා මහත්මිය
   නිරීක්ෂක (භාණ්ඩාගාර නියෝජිත)
   මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# 2018 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

1. එල්.ටී.ඩී. පෙරේරා මිය - සභාපති
   මහා භාණ්ඩාගාර නියෝජිත

2. පියුමන්ති පීරිස් මිය - අතිරේක ලේකම්
   අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

3. එච්.ජී. හුසේන් මයා - කොමසාරිස්
   මානව හිමිකම් කොමිසම

4. විජිතා සෙනෙවිරත්න මිය - අතිරේක ලේකම්
   ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය

5. අයි.එන්. ප්‍රියන්ති මිය - නියෝජිත
   ජාතික විගණන කාර්යාලය

# කාර්ය මණ්ඩලය - 2018

- **<u>ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය</u>**

| | | |
|---|---|---|
| 1.අධ්‍යක්ෂ ජනරාල් | - | උදයකුමාර අමරසිංහ මහතා |
| 2. අධ්‍යක්ෂ (නීති හා නීති බලාත්මක කිරීම) | - | එස්. එස්.කේ. කස්තුරිආරච්චි මෙනවිය |
| 3. අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා වැඩසටහන්) | - | අයි. සිරිවර්ධන මහතා |
| 4. අධ්‍යක්ෂ (පාලන හා කළමනාකරණ) | - | ඩබ්.ජී. එන්. ප්‍රනාන්දු මහතා |
| 5. අධ්‍යක්ෂ (මූල්‍ය) | - | ජී.ඩී.ආර්. පෙරේරා මහත්මිය |
| 6. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | - | ආර්.ඒ.ඩී. චමිලා දිශානි මහත්මිය |
| 7. සහකාර අධ්‍යක්ෂ (නීති) | - | පී. එන්.යූ. පට්ටිආරච්චි මහත්මිය |
| 8. සහකාර අධ්‍යක්ෂ (පාලන හා කළමනාකරණ) | - | ඩබ්. එම්. අජිත් බණ්ඩාර මහතා |
| 9. කළමනාකරණ මණ්ඩල ලේකම් | - | බී.ජී. එම්.එස්.ආර්.ඩබ්. ගුණවර්ධන මහත්මිය |

- **<u>ද්විතීය</u> <u>කාර්ය මණ්ඩලය</u>**

**කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) නිලධාරීන් - 10**

1.සහන් හර්ෂණ අතුකෝරල මහතා

2. එස්.එන්.එච්. නදීෂා මධුමාලි නානායක්කාර මහත්මිය

3. පී.ඒ. දිලිනි දර්ශිකා පෙරේරා මෙනෙවිය

4. එම්.පී. සවිත්‍රා දුලාශනී ගුණසේකර මහත්මිය

5. අයි.ඒ. හර්ෂණී ඉලේපෙරුම මෙනෙවිය

6.දර්ශන් රජීව් ජයමණි මහතා

7.උමේෂා හෂිනි ලොකුසූරිය මෙනෙවිය

8. ඒ.වී.ඩී.එන්.සී.ජයනි සෙනෙවිරත්න මෙනෙවිය

9. හංසිනී එරංගා මුණසිංහ මහත්මිය

10. කේ.ඩී.අයේෂා කිත්මිණි ප්‍රනාන්දු මහත්මිය

- **<u>ප්‍රාථමික කාර්ය මණ්ඩලය</u>**

**රියදුරු**

**රියදුරන් සංඛ්‍යාව - 06**

1. යූ.ඩබ්. විමංග පැතුම් මහතා
2. ඩී.එම්. සම්පත් නිශාන්ත බණ්ඩාර මහතා
3. ඒ. ප්‍රභාත් නිශාන්ත මහතා
4. එස්.බී. භාග්‍ය ප්‍රදීප් මදුසංක මහතා
5. කේ. කසුන් මදුශාන් විමුක්ති මහතා
6. එස්.ගාමිණී විජේකුමාර මහතා

**කාර්යාල කාර්ය සහායකවරුන්**

**කාර්යාල කාර්ය සහායකවරුන් - 06**

1 .ඩබ්. නදීශානී ප්‍රනාන්දු මෙනෙවිය

2. ජේ.ජී. චාමලී මල්කාන්ති විජේවික්‍රම මහත්මිය

3. ඩබ්.එම්. විමල බුද්ධික මහතා

4. ඒ.ඒ. ප්‍රදීප් කුමාර පෙරේරා මහතා

5. ඩබ්.එච්.ආර්. මධුකා ප්‍රබෝධනී මහත්මිය

6.කසුන් මධුසංක යකුපිටිය මහතා


**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය**

**කාර්ය මණ්ඩල සාරාංශය -2018/12/31**

**වගුව 01**

| වර්ගය | වැටුප් කේතය | ක.සේ.දෙ. අනුමත කාර්ය මණ්ඩලය | දැනට පවතින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ***ජ්‍යෙෂ්ඨ මට්ටම*** | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | HM 2-3 | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ | HM 1-3 | 5 | 4 | 1 |
| සහකාර අධ්‍යක්ෂ | MM 1-3 | 3 | 3 | 0 |
| කළමනාකරණ මණ්ඩල ලේකම් | MM 1-3 | 1 | 1 | 0 |
| ***තෘතීය මට්ටම*** | | | | |
| නීති නිලධාරී | JM 1-1 | 2 | 0 | 2 |
| අභ්‍යන්තර විගණන නිලධාරී | JM 1-1 | 1 | 0 | 1 |
| විමර්ශන නිලධාරී | MA 4 | 6 | 0 | 6 |
| රැකවරණ නිලධාරී | MA 4 | 10 | 0 | 10 |
| සන්නිවේදන නිලධාරී | MA 4 | 1 | 0 | 1 |
| තොරතුරු නිලධාරී | MA 4 | 1 | 0 | 1 |
| භාෂා පරිවර්තක | MA 4 | 1 | 0 | 1 |
| ***ද්විතීය මට්ටම*** | | | | |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-1 | 10 | 10 | 0 |
| ***ප්‍රාථමික මට්ටම*** | | | | |
| රියදුරු | PL 3 | 6 | 6 | 0 |
| කාර්යාල කාර්ය සහායක | PL 1 | 6 | 6 | 0 |
| **එකතුව** | | **54** | **31** | **23** |

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත සේවක සංඛ්‍යාව**



# කාර්ය සාධනය

# පාලන හා කළමනාකරණ අංශය

අධිකාරියේ වර්තමාන කාර්ය මණ්ඩලයේ නිපුණතා වර්ධනය කිරීම උදෙසා විවිධ නිපුණතා සංවර්ධන වැඩමුළු සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයන් 2018 වර්ෂයේදී යොමු කරන ලදී. ඒවා පහත පරිදි වේ.

| වැඩසටහන් අංකය | ආයතනයේ නම | තනතුර හා නිලධාරී සංඛ්‍යාව | පුහුණු වැඩසටහනේ නම | පුහුණු දින ගණන |
|---|---|---|---|---|
| 01 | නිපුණතා සංවර්ධන අරමුදල | කළමනාකරණ සහකාර - 02 | දේපළ/උපකරණ සබැඳිව ස්ථාවර වත්කම් පවත්වාගෙන යාම, නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 2018.02.26 |
| 02 | නිපුණතා සංවර්ධන අරමුදල | කළමනාකරණ සහකාර - 10 | තෙදින සේවාරම්භක පුහුණු වැඩමුළුව | 2018.03.19-2018.03.21 |
| 03 | UNODC-Viana | අධ්‍යක්ෂ ජනරාල් - 01 | 27th Session of the Commission on Crime Prevention and Criminal Justice (CCPCJ) | 2018.05.14-2018.05.19 |
| 04 | නිපුණතා සංවර්ධන අරමුදල | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) – 01 හා කළමනාකරණ සහකාර - 01 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ තෙදින වැඩමුළුව | 2018.05.31-2018.06.01 |
| 05 | නිපුණතා සංවර්ධන අරමුදල | රියදුරු - 04 | රියදුරන්ගේ කාර්යභාරය හා වගකීම | 2018.07.19-2018.07.20 |
| 06 | නිපුණතා සංවර්ධන අරමුදල | කළමනාකරණ සහකාර - 02 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව | 2018.07.30-2018.07.31 |
| 07 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | අධ්‍යක්ෂ (මූල්‍ය) - 01 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව | 2018.08.03-2018.08.07 |
| 09 | තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය | සහකාර අධ්‍යක්ෂ (03), කළමනාකරණ මණ්ඩල ලේකම් (01), කළමනාකරණ සහකාර (09), | පරිගණක යෙදවුම් පඨමාලාව | 2018.11.10-2019.02.22 |

| | | | | |
|---|---|---|---|---|
| | | කාර්යාල කාර්ය සාහායක (02) | | |
| 10 | Miloda Academy of Financial Studies | කළමනාකරණ සහකාර -02 | Public Finance Regulations | 26.11.2018-28.11.2018 |
| 11 | නිපුණතා සංවර්ධන අරමුදල /Burapha University Thailand | අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා වැඩසටහන්), අධ්‍යක්ෂ (පාලන හා කළමනාකරණ) -02 | International Training Program on Enterprise Project and Organization Management | 04.11.2018-10.11.2018 |
| 12 | නිපුණතා සංවර්ධන අරමුදල /Reva University of Bangalore | අධ්‍යක්ෂ - මුල්‍ය, කළමනාකරණ මණ්ඩල ලේකම් -02 | Organizational Performance through Enterprise Learning Methodology with Peace of Mind | 19.11.2018-26.11.2018 |

27th Session of the Commission on Crime Prevention and Criminal Justice (CCPCJ) UNODC-Viana

2018.05.14-2018.05.19





International Training Program on Enterprise Project and Organization Management
නිපුණතා සංවර්ධන අරමුදල /Burapha University Thailand
04.11.2018-10.11.2018





Organizational Performance through Enterprise Learning Methodology with Peace of Mind

නිපුණතා සංවර්ධන අරමුදල /Reva University of Bangalore

19.11.2018-26.11.2018







2018 වර්ෂයේ, කළමනාකරණ මණ්ඩල රැස්වීම් සෑම මසකටම දෙවරක් බැගින් රැස්වීම් 24ක් ද, විශේෂ කළමනාකරණ මණ්ඩල රැස්වීම් 01ක් ද, විධායක කමිටු රැස්වීම් 06ක් ද, විගණන කමිටු රැස්වීම් වාර 02ක් ද පැවැත්විණි.

අධිකාරියේ 2018.12.31 වන දින වන විට අධිකාරිය සඳහා බඳවා ගෙන ඇති නිලධාරීන් පිළිබඳව විස්තර පහත පරිදි වේ.


| සේවා වර්ගය | ක.සේ.දෙ. අනුමත කාර්ය මණ්ඩලය | දැනට පවතින කාර්ය මණ්ඩලය |
|---|---|---|
| <u>ජ්‍යෙෂ්ඨ මට්ටම</u><br>අධ්‍යක්ෂ ජනරාල්<br>අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ<br>කළමනාකරණ මණ්ඩල ලේකම් | 10 | 9 |
| <u>තෘතීය මට්ටම</u><br>නීති නිලධාරි<br>අභ්‍යන්තර විගණන නිලධාරි<br>විමර්ශන නිලධාරි<br>රැකවරණ නිලධාරි<br>සන්නිවේදන නිලධාරි<br>තොරතුරු නිලධාරි<br>භාෂා පරිවර්තක | 22 | 0 |
| <u>ද්විතීය මට්ටම</u><br>කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 10 | 10 |
| <u>ප්‍රාථමික මට්ටම</u><br>රියදුරු<br>කාර්යාල කාර්යය සහායක | 12 | 12 |
| එකතුව | **54** | **31** |



# නීති හා නීති බලාත්මක කිරීමේ අංශය

2018 වසරේ ජනවාරි මස 01 වන දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නීති හා නීති බලාත්මක කිරීමේ අංශය වෙත මහජනතාව හා රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද ඉල්ලීම් සහ පැමිණිලි ගණන 86ක් වේ. එක් ලිපියක ඉල්ලීම් කිහිපයක් පැවති අවස්ථාද දක්නට ලැබුණු අතර අදාළ ලිපි ඒවායේ සඳහන් ඉල්ලීම් අනුව පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| ඉල්ලීමේ ස්වභාවය | ඉල්ලීම් ගණන |
|---|---|
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි | 20 |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | 06 |
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 11 |
| සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 11 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | 01 |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 02 |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 08 |
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 02 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 02 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි, ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| අයිතිවාසිකම් සහ හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි, 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| අයිතිවාසිකම් සහ හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි, 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි, සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| වෙනත් ඉල්ලීම් | 19 |
| **එකතුව** | 86 |




2016 වසරේ සහ 2017 වසරේ පැමිණිලි අතුරින් පැමිණිලි 29ක් 2018.01.01 වන විටත් අවසන්ව නොපැවති අතර මේ අනුව පැමිණිලි 115ක් 2018 වසර තුළ විමර්ශනයට භාජනය කර ලදී. අධිකාරියට ලැබුණු සමස්ථ පැමිණිලි අතරින් පැමිණිලි 63 ක විමර්ශන කටයුතු 2018 වසර අවසන් වන විට සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.

- **<u>2018 වසර තුළදී විමර්ශනය අවසන් කරන ලද පැමිණිලිවල සාරාංශය</u>**

| ඉල්ලීමේ ස්වභාවය | අනු අංකය | ප්‍රතිඵලය |
|---|---|---|
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි | (48) – VWPA/COM/KAL/02 | සහකාර පොලිස් අධිකාරිගේ වාර්තාවට අනුව සිද්ධියට වගකිවයුතු පොලිස් නිලධාරින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් පැමිණිලිකරුගේ අයිතීන් සුරැකී ඇත. |
| | (44) - VWPA/COM/KAL/03 | අදාළ පොලිස් ස්ථානය විසින් විත්තිකරුට එරෙහිව නඩු පවරා ඇති බැවින් පැමිණිලිකරුගේ අයිතීන් සුරැකී ඇත |
| | (66) – VWPA/L&LE/RE/3/18 | අදාළ පැමිණිල්ල පාර්ශවයන් දෙක අතර සමථ වී ඇති බව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කොළඹ උතුර විසින් දැනුම් දීම මත පැමිණිල්ලේ කටයුතු අවසන් කිරීමට කළමනාකරණ මණ්ඩලය තීරණය කරන ලදී. |

| | | |
|---|---|---|
| | (67) - VWPA/L&LE/RE/4/18 | පැමිණිලිකාරිය පොලිස් විමර්ශන සම්බන්ධයෙන් සෑහීමකට පත්ව ඇති බව පැමිණිලිකාරියගේ නීතිඥවරිය විසින් ලිපියකින් දැනුම් දීම මත පැමිණිල්ලේ කටයුතු අවසන් කරන ලදී. |
| | (68) - VWPA/L&LE/RE/5/18 | පොලිස් කොට්ඨාසයේ වාර්තාවට අනුව පැමිණිලිකරු අපරාධයක වින්දිතයෙකු හෝ සාක්ෂිකරුවකු නොවන බැවින් 2018.02.06 දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී පැමිණිල්ලේ කටයුතු අවශා කිරීමට තීරණය කරන ලදී. |
| | (75) -VWPA/L&LE/RE/8/18 | පැමිණිලිකාරිය විසින් පැමිණිල්ල සිදු කරන ලද්දේ විත්තිකරුට ලබා දුන් දඩුවම ඇසීමට ඇය හට අවස්ථාවක් නොලැබුණු බව සඳහන් කරමිනි. මෙම පියවර ගැනීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කළ යුතුව ඇත. අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීමට කමිටුවක් පත් කර ඇති බැවින් සහ එතෙක් මෙවැනි කටයුතු සඳහා මැදිහත් වීමට නෛතික බාධාවක් පවතින බැවින් කළමනාකරණ මණ්ඩල තීරණය අනුව පැමිණිලිකාරියට ඒ බව දැනුම්දී පැමිණිල්ලේ කටයුතු අවසන් කරන ලදී. |
| | (92) - VWPA/L&LE/RE/12/18 | මෙම පැමිණිල්ල පනතේ විෂය පථයට නොගැනෙන බව කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| | (94) - VWPA/L&LE /RE/13/18 | පොලිස් වර්තාවට අනුව පැමිණිලි කරුගේ අයිතිවාසිකම් සුරකි ඇති බැවින් පැමිණිල්ලේ කටයුතු අවසන් කරන ලදී. |
| | (110) - VWPA/L&LE/RE/18/18 | පැමිණිලිකාරියගේ ඉල්ලීම සපුරා ඇත. |
| | (135) - VWPA/L&LE/RE/23/18 | පොලිස් වාර්තාවට අනුව පැමිණිලිකරුගේ අයිතිවාසිකම් සුරකී ඇත. එබැවින් පැමිණිල්ලේ කටයුතු අවසන් කරන ලදී. |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | (26) - VWPA/COM/COL/09 | අදාළ පොලිස් ස්ථාන විසින් පැමිණිලිකරුගේ පැමිණිල්ල නිසිලෙස විමර්ශනය කර ඇති බැවින් ද තර්ජන තක්සේරු වාර්තා අනුව තර්ජනයක් නොමැති බැවින්ද 2018.02.09 වන දින පැවැති තාක්ෂණික කමිටු රුස්වීමේදී පැමිණිල්ලේ කටයතු අවසන් කිරීමට තීරණයක කරන ලදී. |
| | (64) - VWPA/L&LE/0/2/18 | පොලිස් කොට්ඨාසයේ වාර්තාව අනුව පැමිණිලිකරුට තර්ජනයක් නොමැති බැවින් 2018.02.06 වන දින පැවැති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී පැමිණිල්ලේ කටයුතු අවසන් කිරීමට තීරණය කරන ලදී. |

| | | |
|---|---|---|
| | (86) - VWPA/L&LE/0/10/18 | පනතේ 8 සහ 9 පවගන්ති යටතේ වරදක් අනාවරණය නොවන බැවින් 2018.10.13 දින පැවැති තාක්ෂණික කමිටු රැස්වීමේදී පැමිණිල්ලේ කටයුතු අවසන් කිරීමට තීරණය කරන ලදී. |
| | (93) - VWPA/L&LE/0/11/18 | පොලිස් කොට්ඨාසයේ වාර්තාව අනුව පනතේ 8 සහ 9 වගන්ති යටතේ වරදක් අනාවරණය නොවන බැවින් 2018.09.11 දින පැවැති කලමනාකරණ මණ්ඩල රැස්වීමේදී පැමිණිල්ලේ කටයුතු අවසන් කිරිමට තීරණය කරන ලදී. |
| | (95) - VWPA/L&LE/0/12/18 | පොලිස් කොට්ඨාසයේ වාර්තාව අනුව පනතේ 8 සහ 9 වගන්ති යටතේ කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොමැති බැවින් 2018.06.14 දින පැවැති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී පැමිණිල්ලේ කටයුතු අවසන් කිරීමට තීරණය කරන ලදී. |
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | (03) – VWPA/COM/HAM/02 | 2018.01.24 දිනැති පැමිණිලිකරුගේ ප්‍රකාශය අනුව එම අවස්ථාව වන විට පැමිණිකිකරුට තර්ජනයක් නොමැති බැවින් පැමිණිල්ලේ කටයුතු අවසන් කරන ලදී. |
| | (14)- VWPA/COM/INT/01 | පොලිස් කොට්ඨාසයෙන් ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව තර්ජනයක් නොමැති බවට වාර්තා කර ඇත. ඒ අනුව 2018.02.09 දින පැවති තාක්ෂණික කමිටු රැස්වීමේදී මෙම ලිපි ගොනුවේ කටයුතු අවසන් කිරිමට තීරණය කර ඇත. |
| | (35) – VWPA/COM/KAL/01 | පොලිස් කොට්ඨාසයෙන් වාර්තාවට අනුව තර්ජනයක් හෝ බලපෑම් කිරීමක් නොමැති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | (54)- VWPA/COM/COL/19 | පැමිණිල්ල වසා දමන ලෙසට පැමිණිකරු විසින් සිදු කළ ඉල්ලීම මත 2018.06.14 දින පැවැති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | (91)- VWPA/L&LE/P/5/18 | මෙම පැමිණිල්ල අධිකාරිය වෙත යොමු කර ඇත්තේ ළමා මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගයකට එරෙහිවය. අධිකරණ නියෝගයක් අභිබවා කටයුතුකිරිමට අධිකාරියට හැකියාවක් නොමැති බැවින් ඒ බව පැමිණිලිකාරියට දැනුම් දී ලිපිගොනුවේ කටයුතු අවසන් කිරීමට කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| | (100)- VWPA/L&LE/P/7/18 | මෙම පැමිණිල්ල අධිකාරියේ විෂය පථයට අයත් නොවන බැවින් 2018.09.11දින පැවැති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී පැමිණිල්ලේ කටයුතු අවසන් කිරීමට තීරණය කරන ලදී. |

| | | |
|---|---|---|
| සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | (23)- VWPA/COM/COL/6 | මෙම පැමිණිල්ලට අදාළ නඩුව දෙපාර්ශවය විසින් සමථයකට ප ත්ව ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | (60)- VWPA/L&LE/P/2/17<br>VWPA/L&LE/0/2/17 | ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ වාර්තාවට අනුව පැමිණිලිකරු අදාළ නඩුවේ සාක්ෂිකරුවෙකු නොවන බැවින් 2018.05.08 දින පැවැති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කිරීමට තීරණය කරන ලදී. |
| | (98)- VWPA/L&LE/0/13/18<br>VWPA/L&LE/P/6/18 | පොලිස් කොට්ඨාස වාර්තාවේ නිර්දේශ ප්‍රකාරව මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කිරීමට 2018.10.13 දින පැවැති තාක්ෂණික කමිටු රැස්වීමේදී තීරණය කරන ලදී. |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | (62)- VWPA/L&LE/RE/01/18<br>VWPA/L&LE/0/1/18 | පැමිණිලිකරුගේ ස්ථාන මාරුව සිදුකර ඇත්තේ විධිමත් ක්‍රමවේදය යටතේ වන බැවින් මෙම ලිපිගොනුවේ කටයුත අවස්න කිරීමට තීරණය කරන ලදී. |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | (56)- VWPA/L&LE/RE/1/17<br>VWPA/L&LE/0/1/17<br>VWPA/L&LE/P/1/17 | පොලිස් කොට්ඨාසයේ වාර්තාවට අනුව පැමිණිකරු අපරාධකරු සමඟ සමථයකට පත්ව ඇති බැවින් ලිපගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| වෙනත් ඉල්ලීම් | (13) – VWPA/COM/NUW/01 | ග්‍රාම නිලධාරී වාර්තාවට අනුව පැමිණිලිකරු හට තර්ජනයක් නොමැති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | (40)- VWPA/COM/KAL/02 | මෙම පැමිණිල්ලට අදාල සිද්ධිය සම්බන්ධයෙන් සිවිල් නඩුවක් ගොනු කර ගැනීමට පැමිණිලකරු එකඟ වී ඇත. එබැවින් 2018.02.09 දින පැවති තාක්ෂණික කමිටු රැස්වීමේදී මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | (59)- VWPA/L&LE/MISO//01/17 | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම පැමිණිල්ලට අදාළ විමර්ශන කටයුතු සිදුකර ඇති අතර එකී විමර්ශන අනුව වරද සිදුව ඇත්තේ ශ්‍රී ලංකාවෙන් පිටත බැවින් අපරාධකරුවන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට බලයක් නොමැති බව අධිකාරිය වෙත දැනුම් දී ඇත. එබැවින් ලිපිගොනුවේ කටයුතු අවස්න කරන ලදී. |
| | (107)- VWPA/L&LE/MISC/11/18 | මෙම පැමිණිල්ල අධිකාරියේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කිරීමට 2018.09.27 දින අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරන ලදී. |

| | | |
|---|---|---|
| | (115)-VWPA/L&LE/ MISC/11/18 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ වාර්තාව අනුව ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | (106)- VWPA/L&LE/MISC/9/18 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිගේ වාර්තාව අනුව ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | (104)- VWPA/L&LE/MISC/8/18 | පැමිණිල්ල අධිකාරියේ විෂය පථයට අයත් වන්නක් නොවන බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |

# ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය

වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය සවිබල ගැන්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) රුපියල් මිලියන 40 ක ප්‍රදානයක් ලබා දුන් අතර එම ගිවිසුම 2017.11.24 දින අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ සභාපති හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ විසින් අත්සන් කරන ලදී. එම ගිවිසුම ප්‍රකාරව අදාළ මුදල්, අධිකාරියේ ගිණුමට 2018 පෙබරවාරි මස බැර වූ අතර ඒවා යටිතල පහසුකම් සංවර්ධනයට හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යොදා ගනු ලැබූ අතර තවදුරටත් එම ප්‍රතිපාදන අධිකාරියේ විවිධ කාර්යයන් සඳහා යොදා ගැනේ.

ඒ අනුව අධිකාරියේ ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය යටතේ යුක්තිය පසඳලීමේ ක්‍රියාවලියට දායක වන විවිධ නිලධාරීන් වන,

- පොලිස් ස්ථානාධිපතිවරු හා මුලස්ථාන පොලිස් පරීක්ෂකවරුන්
- නීතිඥවරුන්
- අධිකරණ වෛද්‍ය නිලධාරීන්
- බන්ධනාගාර කොමසාරිස්වරුන් සහ අධිකාරිවරුන්

දැනුවත් කිරීමේ වැඩසටහන් සමස්ථ දිවයින ආවරණය වන පරිදි සාර්ථකව නිම කරන ලදී.

2018 වර්ෂයේදී සිදු කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

| පොලිස් ස්ථානාධිපතිවරු හා මුලස්ථාන පොලිස් පරීක්ෂක නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | | | |
|---|---|---|---|
| වැඩසටහන | පැවැත්වූ දිනය | පැවැත්වූ ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
| 01-බස්නාහිර පළාත - පළමු අදියර | 2018.03.22-2018.03.23 | බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව (B.M.I.C.H) | 54 |
| 02-බස්නාහිර පළාත - දෙවන අදියර | 2018.04.23-2018.04.24 | බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව (B.M.I.CH) | 56 |
| 03- මධ්‍යම පළාත | 2018.05.30-2018.05.31 | සමුපකාර සංවර්ධන ආයතනය (N.I.C.D) - පොල්ගොල්ල | 61 |
| 04-දකුණු පළාත | 2018.06.12-2018.06.13 | Pearl Cliff Hotel- මාතර | 61 |

| | | | |
|---|---|---|---|
| 05-සබරගමු පළාත | 2018.06.28-2018.06.29 | Hotel Grand Guardian - රත්නපුර | 28 |
| 06-නැගෙනහිර පළාත | 2018.07.25-2018.07.26 | Monty Hotel - අම්පාර | 54 |
| 07-උතුරු මැද පළාත | 2018.08.24-2018.08.25 | Heritage Hotel - අනුරාධපුර | 36 |
| 08-ඌව පළාත | 26.10.2018-27.10.2018 | Grand Heritage Hotel – බදුල්ල | 38 |
| 09- වයඹ පළාත | 13.10.2018-14.10.2018 | Carolina Beach Hotel – හලාවත | 47 |
| 10- උතුරු පළාත | 05.12.2018-06.12.2018 | Tilko Hotel – යාපනය | 52 |
| අනෙකුත් වැඩසටහන් | | | |
| 11-අධිකරණ වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 2018.05.25 | බණ්ඩාර6නායක සම්මන්ත්‍රණ ශාලාව (B.M.I.CH) | 60 |
| 12- ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමය දැනුවත් කිරීමේ වැඩසටහන | 2018.07.07 | Hotel Grand Monarch | 100 |
| 13- නීති ආධාර කොමිෂන් සභා නීතිඥවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 2018.07.21 | බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව (B.M.I.CH) | 60 |
| 14- බන්ධනාගාර කොමසාරිස්වරුන් සහ අධිකාරිවරුන් | 10.12.2018 | B.M.I.CH | 40 |

**බස්නාහිර පළාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම - 1 අදියර**

දිනය – 2018.03.22 – 2018.03.23

ස්ථානය – බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව

නිලධාරින් සංඛ්‍යාව– 54










**බස්නාහිර පළාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම - 2අදියර**

දිනය - 2018.04.23 – 2018.04.24

ස්ථානය – බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව

නිලධාරින් සංඛ්‍යාව – 56








;




**මධ්‍යම පළාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම**

දිනය - 2018.05.30 – 2018.05.31

ස්ථානය – සමූපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල

නිලධාරින් සංඛ්‍යාව – 61









දකුණු පළාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම

දිනය - 2018.06.12 -2018.06.13

ස්ථානය – Peral Cliff Hotel - මාතර

නිලධාරින් සංඛ්‍යාව – 61













සබරගමු පළාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම

දිනය - 2018.06.28 – 2018.06.29

ස්ථානය – Hotel Grand Guardian - රත්නපුර

නිලධාරින් සංඛ්‍යාව – 28






**නැගෙනහිර පළාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම**

දිනය - 2018.07.25 – 2018.07.26

ස්ථානය – Monty Hotel - අම්පාර

නිලධාරින් සංඛ්‍යාව – 54







**උතුරු මැද පළාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම**

දිනය - 2018.08.24 – 2018.08.25

ස්ථානය – Heritage Hotel - අනුරාධපුර

නිලධාරින් සංඛ්‍යාව – 36












ඌව පළාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම

දිනය - 2018.10.26 – 2018.10.27

ස්ථානය – Grand Heritage Hotel - බදුල්ල

නිලධාරින් සංඛ්‍යාව – 38














වයඹ පළාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම

දිනය - 2018.10.13 – 2018.10.14

ස්ථානය – Carolina Beach Hotel – හලාවත

නිලධාරින් සංඛ්‍යාව – 47



### උතුරු පළාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම

දිනය - 2018.12.05 – 2018.12.06

ස්ථානය – Tilko Hotel - යාපනය

නිලධාරීන් සංඛ්‍යාව – 52













### අධිකරණ වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීම

දිනය - 2018.05.25

ස්ථානය – බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව

නිලධාරීන් සංඛ්‍යාව – 60


















**ශ්‍රී ලංකා නීතීඥවරුන්ගේ සංගමය දැනුවත් කිරීම**

දිනය - 2018.07.07

ස්ථානය – Hotel Grand Monarch - තලවතුගොඩ

නිලධාරින් සංඛ්‍යාව – 100












**නීති ආධාර කොමිෂන් සභා නීතිඥවරුන් දැනුවත් කිරීම**

දිනය - 2018.07.21

ස්ථානය – බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව

නිලධාරින් සංඛ්‍යාව – 60












**බන්ධනාගාර කොමසාරිස්වරුන් සහා අධිකාරිවරුන් දැනුවත් කිරීම**

දිනය - 2018.12.10

ස්ථානය – බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව

නිලධාරින් සංඛ්‍යාව – 40













- ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් (Transparency International) මගින් අපරාධ වින්දිතයන් ආරක්ෂා කිරීමේ හා සාක්ෂිකරුවන්ට සහය දීමේ පනත හා ඔවුන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් අන්තර්ගත කරමින් මුද්‍රණය කරන ලද අත්පොත් 3000ක් 2018 වර්ෂයේ සපයන ලදී.
- 2018 වර්ෂයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමග නිරන්තර සබඳතා පවත්වාගෙන යමින් අධිකාරියේ ප්‍රගතිය වාර්තා කරන ලදී.
- අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් 2018.08.31 වන දින සංවිධානය කරන ලද ආධාර ලබා ගැනීම සඳහා වූ සමුළුවේදී (Donor Forum), අධිකාරියේ අවශ්‍යතා හා ඉදිරි වැඩපිළිවෙල අන්තර්ගත කරමින් යෝජනා මාලාවක් ඉදිරිපත් කරන ලද අතර එය ඇතුලත් වාර්තාවක් අමාත්‍යාංශයට භාරදෙන ලදී.
- අධිකාරියේ සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් බන්ධනාගාර කොමසාරිස්වරුන් සමඟ ඉදිරි වැඩපිළිවෙල පිළිබඳව විශේෂ වැඩසටහනක් දෙසැම්බර් 21 දින අධිකාරියේදී පවත්වන ලදී. මේ සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා වැඩසටහන්), අධ්‍යක්ෂ (නීති හා නීති බලාත්මක කිරීම්), අධ්‍යක්ෂ (පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය), සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ තාක්ෂණික විශේෂඥවරිය සහභාගි විය.

# මූල්‍ය අංශය

# 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.) | 2018.12.31 දිනට වියදම (රු.මි.) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| රජයේ පුනරාවර්තන වියදම | 32.60 | 31.17 | 95.61% |
| රජයේ ප්‍රාග්ධන වියදම | 15.00 | 9.13 | 60.86% |
| UNDP අරමුදලින් කළ වියදම | 21.66 | 18.70 | 86.33% |
| එකතුව | **69.26** | **59.00** | **85.18%** |

# 2018.12.31න් අවසන් වන වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1. සංස්ථානික තොරතුරු**

### 1.1. ස්ථාපිත කිරීම හා නෛතික පසුබිම

2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය ස්ථාපිත කරන ලද අතර, අධිකරණ අමාත්‍යාංශය යටතේ එහි සේවා සැපයෙන ක්ෂේත්‍රය පුළුල් කෙරිණි. එහි ප්‍රධාන කාර්යාලය පළමු මහළ, 428/11ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

පනතෙහි අරමුණු ළඟා කර ගැනීමට අදාළව අධිකාරියේ රාජකාරි හා කාර්යයන් 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතෙහි 13 වන වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇත.

### 1.3 සේවකයන් සංඛ්‍යාව

2018 වසර අවසන් වන විට සේවක සංඛ්‍යාව 30ක් විය.

**2 සැකසීමේ පදනම**

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සංචිත වෙනස්වීම හා මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් ආදියෙන් සමන්විත වේ. මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් දක්වා ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කරනු ලැබේ.

### 2.2. ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවල උද්ධමනීය සාධක සඳහා කිසිදු ගැලපුමක් නොකරන ලදී.

### 2.2 කෘත්‍යාත්මක මුදල්

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියේ කෘත්‍යාත්මක මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කෙරේ.

## 3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලු කාල සීමාවන් සඳහා නිත්‍ය වශයෙන් අදාළ කර ගන්නා ලදී.

### 3.1. දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණවලට අදාළ පිරිවැය යනු අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ අපේක්ෂිත භාවිතය සඳහා අදාළ වත්කම ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමේ දී දැරීමට වන වියදම වේ. මූලිකව වත්කම පිරිවැයට හඳුනා ගැනීමෙන් පසුව ප්‍රත්‍යාගණනයට ලක් කළ වත්කම් ඉන් පසු ක්ෂය අඩු කිරීමෙන් අනතුරුව වන ප්‍රත්‍යාගණනය කරන ලද අගය මත පවත්වාගෙන යනු ලැබේ. අනෙක් සියළු දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසු පිරිවැයට පෙන්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල අයිතමයක් විවිධ ප්‍රයෝජනවත් ජීවකාලයන් සහිත සංරචකවලින් යුක්ත වන විට ඒවා දේපළ, පිරියත හා උපකරණවල තනි අයිතම සඳහා අදාළ කර ගනු ලැබේ.

එක් එක් මුදල් වර්ෂය අවසානයේ වත්කමෙහි ශේෂ අගයන්, ප්‍රයෝජනවත් ජීව කාල හා ක්ෂය වීමේ ක්‍රම සමාලෝචනය කර යෝග්‍ය නම් ගලපනු ලැබේ.

### ප්‍රදානයන් ලෙස ලද දේපළ, පිරියත හා උපකරණ

ඕනෑම ප්‍රදානයක් යටතේ අත්පත් කර ගත් දේපළ, පිරියත හා උපකරණයක පිරිවැයට ප්‍රාග්ධනීත කෙරේ.

සින්නක්කර ඉඩම් හැර අනෙක් සියළු දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසු පිරිවැයට පෙන්වනු ලැබේ. සින්නක්කර ඉඩම් පිරිවැයට පෙන්වනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර සියලු දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂය ගණනය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට පිරිවැය කපා හැරීම සඳහා ය.

වසර සඳහා ක්ෂය වෙන් කරන ලද්දේ සමානුපාතික පදනම මත ය.

පහත දක්වා ඇති පරිදි දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කරනු ලබන්නේ සියලු මාර්ග ක්‍රමය මත යි. තවද සියළු දේපළ, පිරියත හා උපකරණ **SLPSAS 7** - දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති පිරිවැය ක්‍රමය මත ගිණුම් තබන ලදී.

| | | |
|---|---|---|
| 1. | මෝටර් රථ | 20% |
| 2. | පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% |
| 3. | පරිගණක හා උපාංග | 25% |
| 4. | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 10% |
| 5. | ගොඩනැගිලි | 4% |
| 6. | මෘදුකාංග | 25% |
| 7. | වෙනත් | 10% |

දේපළ, පිරියත හා උපකරණවලට අයත් අයිතමයක් ඉවත් කරනු ලබන්නේ බැහැර කිරීමේ දී හෝ එහි භාවිතය හෝ බැහැර කිරීම තුළින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන අවස්ථාවකදී ය. වත්කමක් ඉවත් කිරීමේ දී සිදු වන ලාභයක් හෝ පාඩුවක් (ඉවත් කිරීම්වලින් ශුද්ධ ලැබෙන මුදල හා වත්කම දරන ලද අගය අතර වෙනස ලෙස ගණනය කළ) වත්කම ඉවත් කරන වසරෙහි ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

මූලිකව තක්සේරු කරන ලද කාර්යසාධන ප්‍රමිති මගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වාගෙන යාමේ අරමුණින් දේපළ, පිරියත හා උපකරණව අළුත්වැඩියා කිරීම හෝ නඩත්තුව සඳහා වන වියදම එය ඇති වූ අවස්ථාවේ දී වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 3.2 භාණ්ඩ තොගය

මූල්‍ය වර්ෂය තුළ භාවිතා කරනු ලබන භාණ්ඩ තොගය ආදායම් හා වියදම් ප්‍රකාශනයේ පිරිවැයට අගය කර ඇත.

පිරිවැය, විකුණුම් මිළ හෝ ශුද්ධ උපලබ්ධි අගය යන තුනෙන් වඩා අඩු අගය මත ඉතිරි භාණ්ඩ තොගය අගය කරනු ලැබේ.

### 3.3. මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ, අතැති මුදල් හා බැංකුවෙහි ඇති මුදල්වලින් සමන්විත වේ.

### 3.4. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කරන ලදී.

### 3.5. වගකීම් හා වෙන් කිරීම්

පසුගිය සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් ඇති විට ශේෂ පත්‍රයෙහි වගකීම් හඳුනා ගනු ලබන අතර එය නිරවුල් කිරීමේ දී ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් ගලා යාමක් සිදු වෙතැයි අපේක්ෂා කෙරේ. ණය හිමියන්ගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍රයේ දිනයේ සිට වසකර කාලයක් තුළ පියවිය හැකි බැඳීම් ශේෂ පත්‍රයෙහි ජංගම වගකීම් ලෙස සලකනු ලැබේ.

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියට විශ්වසනීය ලෙස ඇස්තමේන්තුගත කළ හැකි වර්තමාන නෛතික හෝ වැඩදායී බැඳීමක් වේ නම් හා අදාළ බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා යාමක් අවශ්‍ය වේ නම් වෙන්කිරීම් හඳුනා ගත හැකිය.

### 3.6. බදුකරණය

බදු වියදම් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් කර ඇති අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි සහ එහි සංශෝධනවල විධිවිධානවලට අනුව ගණනය කර ඇත.

## 3.7. සේවක ප්‍රතිලාභ

### I. නිර්වාචිත දායකත්ව සැලැස්ම

නිර්වාචිත දායකත්ව සැලැස්ම පිළිබඳ බැඳීම සිදු කළ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ. අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය මගින් අර්ථසාධක අරමුදල හා සේවක භාර අරමුදල වෙත සේවකයන්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% හා 3% දායකත්වයක් දරනු ලැබේ.

### II. නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

පාරිතෝෂිකය යනු නිර්වාචික ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ නීතිය අනුව පාරිතෝෂිකය ගෙවීමට අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය බැඳී සිටියි. මෙම වගකීම ඉටු කිරීම සඳහා සේවය කළ පළමු වසරින් ආරම්භ කර සේවා කාලයෙහි සම්පූර්ණ කරන එක් එක් වසර සඳහා සියළු ම සේවකයන්ගේ පසුගිය මුදල් වර්ෂයෙහි අවසන් වරට ලබා ගත් අඩ මසක වැටුප මත පදනම්ව ගණනය කරන මුදලට සමාන ප්‍රතිපාදනයක් ශේෂ පත්‍රයෙහි ඉදිරියට ගෙන එනු ලැබේ.

1993 අංක 12 දරන පාරිතෝෂිකය ගෙවීමේ පනත යටතේ ගෙවිය හැකි පාරිතෝෂිකයට අදාළව සියළු සේවකයන් සඳහා විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙන් කෙරේ. මෙම අයිතමය ශේෂ පත්‍රයෙහි ජංගම නොවන වගකීම් යටතේ කාණ්ඩ ගත කෙරේ.

මහා භාණ්ඩාගාරයට අනුව ඔවුන් අවශ්‍ය වූ විට අරමුදල් පිරිනමන බැවින් මේ සඳහා අරමුදලක් අවශ්‍ය නොවේ.

## 3.8. අධිකාරියේ අරමුදල්

පනතෙහි 18 හා 29 වන වගන්තීන් ප්‍රකාරව අරමුදල් දෙකක් (2) අධිකාරිය සතුවේ.

1. අධිකාරියේ අරමුදල

   මෙම අරමුදල සඳහා පහත අයුරින් මුදල් බැර කළ යුතුය.
   - අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් වරින් වර සම්මත කෙරෙන සියලුම මුදල්
   හා
   -පරිත්‍යාගයන්, ත්‍යාග, පැවරීම් හා ප්‍රදානයන් ලෙස ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත මූලාශ්‍රයන්ගෙන් ලැබෙන අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල්.

   පනත යටතේ අධිකාරියේ රාජකාරි හා කාර්යයන් ඉටු කිරීමේ දී සිදු වන වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුත්තේ ය.

2. ආරක්ෂක අරමුදල

   ආරක්ෂක අරමුදල සඳහා මුදල් බැර කිරීම පහත පරිදි සිදු කළ යුත්තේ ය.

-අරමුදල සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරෙන සියලු මුදල්;
- පරිත්‍යාගයන්, ත්‍යාග, පැවරීම් හා ප්‍රදානයන් ලෙස දේශීය හා විදේශීය මූලාශ්‍රයන්ගෙන් අධිකාරිය වෙත ලැබෙන ආරක්ෂක අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට නියමිත සියලු මුදල්.
-28 වන වගන්තියෙහි (1) (අ) (ii) උප වගන්ති යටතේ අධිකරණය විසින් ප්‍රේෂණය කෙරෙන සියලු මුදල්.

29 වන වගන්තියෙහි (4) (අ) හා (ආ) උප වගන්ති යටතේ වන ගෙවීම් සඳහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට ආරක්ෂක අරමුදලින් ගෙවීම් සිදු කෙරේ.

## 3.9. ආදායම හඳුනාගැනීම

### 3.9.1 ආදායම හඳුනාගැනීම

වන වගන්තියෙහි (1) (අ) (ii) උප වගන්ති යටතේ අධිකරණය විසින් ප්‍රේෂණය කෙරෙන සියලු මුදල් ලැබීමේ පදනම මත ගණනය කරනු ලබන අතර පොළිය හා වෙනත් සියලු ආදායම් උපචිත පදනම මත ගණනය කෙරේ.

### 3.9.2 වියදම

මණ්ඩලය පවත්වාගෙන යාමේ දී දරන ලද සියලු වියදම් උපචිත පදනම මත ගණනය කරන ලද අතර මණ්ඩලයේ ඉපයීමේ ධාරිතාව පවත්වාගෙන යාම හෝ ඉහළ නැංවීම සඳහා ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීම, ව්‍යාප්ත කිරීම හෝ සංවර්ධනය කිරීමට අදාළව දරන ලද සියලු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබීය.

## 3.10. සංසන්දනාත්මක තොරතුරු

අවශ්‍ය වූ විට වර්තමාන වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යාවන් යළි සකස් කරන ලදී.

## 3.11. ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්

ශේෂ පත්‍රයට පෙර සියළු සිදුවීම් සලකා බලන ලද අතර යෝග්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනයට අදාළව ගැලපීම් හෝ අනාවරණයන් සිදු කරන ලදී.

## 3.12. වගකීම් හා අවිනිශ්චිතතාවන්

අවිනිශ්චිතතාවන් යනු පසුගිය සිදුවීම්වලට අදාළ වත්කම් හෝ බැදීම් වන අතර මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බට වන අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇති වීම හෝ ඇති නොවීම මත තහවුරු කරනු ලැබේ.

## 3.13. ප්‍රදානයන් ගිණුම්ගත කිරීම

**i.** රාජ්‍ය ප්‍රදානයන්

ඉදිරිපත් කිරීමේ ක්‍රම ඇතුළු රාජ්‍ය ප්‍රදානයන් සඳහා භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත පරිදි වේ.

අ. වත්කම් මිළ දී ගැනීම සඳහා වන රාජ්‍ය ප්‍රදානයන් වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

ආ. ලැබෙන වෙනත් ප්‍රදානයන් මෙන් ම ඉන් පසු සිදුව ඇති වන වියදම් ලාභ හා පාඩුවල ඇතුළත් කරන ලදී.

## 3.14. ආයෝජනය

යෝග්‍ය හා ආරක්ෂිත ආකාරයට එහි අරමුදල වෙත බැර කර ඇති මුදල් ආයෝජනය කිරීම, බැංකුවෙහි ජංගම, ඉතුරුම් හො තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ 14 වන වගන්තියෙහි (ආ) උප වගන්තිය යටතේ විස්තර කෙරේ.

පනතට අනුකූල වන පරිදි එහි අරමුදලට බැර කරන ලද මුදල් යෝග්‍ය හා ආරක්ෂිත ආකාරයට මූල්‍ය උපකරණවල ආයෝජනය කරනු ලැබේ. එම ආයෝජන පිරිවැය පදනම මත ගිණුම්ගත කරනු ලබන අතර එවැනි ආයෝජන මගින් උපයන ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය

**2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන් අංක | 2018 රුපියල් | 2017 රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| අතැති මුදල් හා බැංකුවෙහි ඇති මුදල් | **08** | 555,800 | - |
| බැරකම් | **09** | 15,000 | - |
| අනෙකුත් වත්කම් | **10** | 1,159,720 | - |
| **මුළු ජංගම වත්කම්** | | **1,730,520** | **-** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | **11** | 15,482,742 | 2,661,292 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **15,482,742** | **2,661,293** |
| **මුළු වත්කම්** | | **17,213,262** | **2,661,292** |
| අඩු කළා: | | | |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | **12** | **246,514** | - |
| **මුළු ජංගම වගකීම්** | | **246,514** | **-** |
| **ශුද්ධ ජංගම වත්කම්** | | **1,484,005** | **-** |
| **ජංගම නොවන වගකීම්** | **13** | **440,404** | **-** |
| **මුළු වගකීම්** | | **686,919** | **-** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **16,526,343** | **2,661,292** |
| **මූල්‍යනය සිදු කළේ පහත ආකාරයටයි** | | | |
| සමුච්චිත අරමුදල | **14** | 487,801 | - |
| **අධිකාරියේ ආරක්ෂණ අරමුදල** | **15** | 555,800 | - |
| රාජ්‍ය ප්‍රදානයන් | **16** | 8,139,968 | 2,661,292 |
| UNDP ප්‍රදානයන් | **17** | 7,342,774 | - |
| | | **16,526,343** | **2,661,292** |

"පිටු අංක 1- 5 දක්වා වන මූල්‍ය ප්‍රතිපත්ති සහ, පිටු අංක 10 සිට 15 දක්වා වන සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශයේ වැදගත් කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණ මණ්ඩලය සතු ය. මෙම මූල්‍ය ප්‍රකාශයන් කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇති ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇත."

අත්සන් කලේ:

ජී. ඩී . ආර් . පෙරේරා
අධ්‍යක්ෂ ( මූල්‍ය )

උදයකුමාර අමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

සුහද කේ. ගමලත්
සභාපති

විජිත සේනාරත්න
කළමනාකරණ මණ්ඩල සාමාජික

වෛද්‍ය නීල් ප්‍රනාන්දු
කළමනාකරණ මණ්ඩල සාමාජික

**අපරාධයක වින්දිතයන්හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය**

2018 දෙසැම්බර් 31න් අවසන් වන වසරෙහි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| | සටහන් අංක | 2018 රුපියල් | 2017 (ඔක් - දෙසැ) රුපියල් |
|---|---|---|---|
| **ආදායම** | **1** | | |
| ප්‍රදානයන් | **1.1** | 31,181,249 | 5,123,226 |
| වෙනත් ආදායම් | **1.2** | 23,080,227 | 68,238 |
| **මුළු ආදායම** | | **54,261,476** | **5,191,464** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගලික වේතන | **2** | 22,659,856 | 4,185,310 |
| ගමන් වියදම් | **3** | 310,004 | 42,168 |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | **4** | 2,900,051 | 409,759 |
| නඩත්තුව | **5** | 3,295,380 | 5,590 |
| ගිවිසුම්ගත සේවාවන් | **6** | 23,514,465 | 480,399 |
| ක්ෂය වීම | **7** | 1,093,920 | 68,238 |
| **මුළු වියදම්** | | **53,773,675** | **5,191,464** |
| **අදාළ කාල සීමාව අතිරික්තය/ (හිඟය)** | | **487,801** | **-** |

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

2018 දෙසැම්බර් 31න් අවසන් වන වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2018 රුපියල් | 2017 රුපියල් |
|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු මගින් සිදුවන මුදල් ප්‍රවාහය** | | | |
| වසර සඳහා වන අතිරික්තය/ (හිඟය) | | 487,801 | - |
| අඩු කළා: | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | - | - |
| | ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමාක්ෂය කිරීම | (1,093,920) | (68,238) |
| එකතු කළා : | වසර සඳහා ක්ෂය වීම | 1,093,920 | 68,238 |
| | පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 440,404 | - |
| **කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් අතිරික්තය/ (හිඟය)** | | **928,205** | **-** |
| | භාණ්ඩ තොග වැඩිවීම | (1,159,720) | - |
| | වෙළඳ හා වෙනත් ලැබීම් වැඩි වීම (අඩු වීම) | - | - |
| | පෙර ගෙවීම් ඉහළ යාම | (15,000) | - |
| | උපචිත වියදම් හා ගෙවිය හැකි දේ වැඩි වීම | 246,514 | - |
| | වසර තුළ ගෙවන ලද පාරිතෝෂික | - | - |
| | | **(928,205)** | **-** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **-** | **-** |
| **ආයෝජන කටයුතු මගින් වන මුදල් ප්‍රවාහය** | | | |
| | ස්ථාවර වත්කම් මිල දී ගැනීම | (13,915,369) | - |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලබන මුදල් ආයෝජනය | - | - |
| | | - | - |
| **ආයෝජන කටයුතු මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(13,915,369)** | **-** |
| **මූල්‍ය කටයුතු මගින් වන මුදල් ප්‍රවාහය** | | | |
| | අභ්‍යන්තර අරමුදල සඳහා ශුද්ධ ලැබීම් | 555,800 | - |
| | ප්‍රාග්ධන ප්‍රදාන | 13,915,369 | - |
| **මූල්‍ය කටයුතු මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **14,471,169** | **-** |
| **භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රමාණය** | | **555,800** | **-** |
| **2018. 01.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ** | | **-** | - |
| **2018. 12.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ** | | **555,800** | - |

**අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය**

**2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සංචිතයන්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය**

| | අරමුදල් (රු) | ප්‍රදානයන් (රු) | සමුච්චිත අරමුදල හා සංචිත (රු) | එකතුව (රු) |
|---|---|---|---|---|
| 2017 ජනවාරි 1 දිනට ශේෂය | - | 2,729,531 | - | 2,729,531 |
| වසර තුළ මාරු කිරීම් | - | (68,238) | - | (68,238) |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | **-** | **2,661,292** | **-** | **2,661,292** |
| 2018 ජනවාරි 1 දිනට ශේෂය | - | 2,661,292 | - | 2,661,292 |
| වසර තුළ අය කිරීම් | - | 40,939,171 | 487,801 | 41,426,972 |
| වසර තුළ මාරු කිරීම් | 555,800 | (28,117,722) | - | (27,561,922) |
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | **555,800** | **15,482,742** | **487,801** | **16,526,342** |

| 01 සටහන<br>ආදායම | 2018<br>(රු) | 2017 (ඔක්- දෙසැ)<br>(රු) |
|---|---|---|
| 1.1 - <u>ප්‍රදානයන්</u> | | |
| රාජ්‍ය ප්‍රදානයන්- පුනාරාවර්තන | | |
| වර්ෂය තුළ ලැබීම් | 32,600,000 | 5,462,000 |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | (1,418,751) | (338,774) |
| | 31,181,249 | 5,123,226 |
| 1.2 - <u>වෙනත් ආදායම්</u> | | |
| වෙනත් ආදායම | | |
| වර්ෂය තුළ ලැබීම් | 115,680 | - |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | (115,680) | - |
| | - | - |
| <u>විලම්භිත ආදායම්</u> | | |
| විලම්භිත ආදායම - රාජ්‍ය ප්‍රදානයන් | 3,650,932 | |
| විලම්භිත ආදායම -UNDP ප්‍රදානයන් | 19,429,295 | 68,238 |
| | 23,080,227 | 68,238 |
| **මුළු එකතුව** | **54,261,477** | **5,191,464** |

****2018 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් අධිකාරිය සඳහා රු. 60,000,000.00 ක මුදලක් වෙන් කර ඇත. නමුත්, 2018 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වශයෙන් අවශ්‍යාය වුයේ රු. 32,600,000.00 ක මුදලක් පමණක් වූ අතර ඉතිරි වූ රු. 27, 400, 000.00 ක ප්‍රතිපාදන මුදල, රේඛීය අමාත්‍යාංශය සඳහා නැවත වෙන් කරන ලදී.**

****රේඛීය අමාත්‍යාංශය විසින් පුනරාවර්තන වියදම් සඳහා ලබාදුන් රු. 32,600,000.00 ක අත්තිකාරම් මුදල, 2018.12.31 වන දින පියවන ලදී.**

| **02 සටහන**<br>**වියදම්** | **2018**<br>(රු) | **2017 (ඔක්- දෙසැ)**<br>(රු) |
|---|---|---|
| **පුද්ගලික වේතන** | | |
| වැටුප් හා වේතන | 9,950,484 | 1,662,570 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,581,254 | 302,457 |
| සේවක භාර අරමුදල | 395,314 | 75,614 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 767,749 | 12,886 |
| පාරිතෝෂික | 440,404 | - |
| වැඩ බලන දීමනා | 339,608 | 215,147 |
| ගමන් දීමනා | 1,600,000 | 600,000 |
| ඉන්ධන දීමනා | 1,116,210 | 179,010 |
| ජීවන වියදම් දීමනා | 2,424,500 | 403,520 |
| ගැලපුම් දීමනා | 1,000,807 | 318,620 |
| වෘත්තීය දීමනා | 251,526 | 38,710 |
| කළමනාකාර මණ්ඩල දීමනා | 1,790,000 | 220,000 |
| වෙනත් දීමනා | 1,002,000 | 156,777 |
| **එකතුව** | **22,659,856** | **4,185,310** |

| **03** සටහන<br>**ගමන් වියදම්** | 2018<br>(රු) | 2017 (ඔක්- දෙසැ)<br>(රු) |
|---|---|---|
| ගමන් - දේශීය | 91,478 | 4,100 |
| ගමන් - විදේශීය | 218,526 | 38,068 |
| **එකතුව** | **310,004** | **42,168** |

| **04** සටහන<br>**සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ** | **2018**<br>(රු) | 2017<br>(ඔක්-<br>දෙසැ)<br>(රු) |
|---|---|---|
| මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය | 737,743 | 67,962 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 853,234 | 36,834 |
| නිල ඇඳුම් | 36,000 | - |
| විනෝද කටයුතු | 318,903 | 30,771 |
| වෙළඳ ප්‍රචාරණය | 646,070 | 251,333 |
| පුවත් පත් | 15,600 | - |
| වෙනත් සැපයුම් | 292,501 | 22,860 |
| **එකතුව** | **2,900,051** | **409,759** |

| **05** සටහන<br>**නඩත්තුව** | **2018**<br>(රු) | 2017<br>(ඔක්-<br>දෙසැ)<br>(රු) |
|---|---|---|
| නඩත්තු වියදම් - වාහන | 1,501,580 | - |
| නඩත්තු වියදම් - පිරියත යන්ත්‍රෝපකරණ | 211,280 | 4,590 |
| නඩත්තු වියදම් - ගොඩනැගිල්ල හා ව්‍යුහය | 1,582,520 | 1,000 |
| **එකතුව** | **3,295,380** | **5,590** |

| **06 සටහන**<br>**ගිවිසුම්ගත සේවාවන්** | **2018**<br>(රු) | 2017<br>(ඔක්-දෙසැ)<br>(රු) |
|---|---|---|
| ප්‍රවාහනය | 18,172 | 3,636 |
| විදුලි සංදේශ ගාස්තු | 671,686 | 62,576 |
| තැපැල් ගාස්තු | 28,600 | 755 |
| විදුලිය හා ජලය | 16,732 | 4,927 |
| පවිත්‍රතා ගාස්තු | 766,153 | 406,105 |
| වෙනත් සේවාවන් -රජයේ දැනුවත් කිරීමේ වැඩසටහන් | 3,280,909 | - |
| වෙනත් සේවාවන් -UNDP දැනුවත් කිරීමේ වැඩසටහන් | 18,705,398 | - |
| වෙනත් සේවාවන් - වෙනත් | 26,815 | 2,400 |
| **එකතුව** | **23,514,465** | **480,399** |

| **07 සටහන**<br>**ක්ෂය වීම** | **2018**<br>(රු) | 2017<br>(ඔක්-දෙසැ)<br>(රු) |
|---|---|---|
| ගොඩනැගිලි ව්‍යුහ පුනරුත්ථාපනය - රාජ්‍ය ප්‍රදානයන් | 32,431.91 | - |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ - රාජ්‍ය ප්‍රදානයන් | 327,365.66 | 68,238 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ - UNDP ප්‍රදානයන් | 161,865.01 | - |
| පරිගණක සහ කොටස් - රාජ්‍ය ප්‍රදානයන් | 6,060.27 | - |
| පරිගණක සහ උපාංග - UNDP ප්‍රදානයන් | 562,032.05 | - |
| මෘදුකාංග සංවර්ධනය - රාජ්‍ය ප්‍රදානයන් | 4,164.95 | - |
| **එකතුව** | **1,093,920** | **68,238** |

| **08 සටහන**<br>**අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්** | 2018<br>(රු) | **2017**<br>**(රු)** |
|---|---|---|
| ලංකා බැංකුව -C/A-81479591 | - | - |
| ලංකා බැංකුව - අධිකාරියේ අරමුදල C/A-81624249 | 555,800 | - |
| සුළු මුදල් | - | |
| එකතුව | **555,800** | **-** |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| **09** සටහන<br>තැන්පතු | **2018**<br>(රු) | **2017**<br>(රු) |
|---|---|---|
| ප්‍රතිපූර්ණය කල හැකි තැන්පතු - ඉන්ධන | 15,000 | - |
| **එකතුව** | **15,000** | **-** |

| **10** සටහන<br>**වෙනත් වත්කම්** | **2018**<br>(රු) | **2017**<br>(රු) |
|---|---|---|
| තොග | 1,159,720 | - |
| **එකතුව** | **1,159,720** | **-** |

**11 සටහන**

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

**2018 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්**

| තොරතුරු | ගොඩනැගිලි (රු.) | මෝටර් රථ (රු.) | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (රු.) | පරිගණක (රු.) | පිරියත හා යන්ත්‍රෝපකරණ (රු.) | මෘදුකාංග (රු.) | වෙනත් (රු.) | ඉඩම් (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| **2018 ජනවාරි 01 දිනට පිරිවැය** | **-** | **-** | **2,729,531** | **-** | **-** | **-** | **-** | **-** | |
| එකතු කිරීම් | 1,991,278 | - | 6,450,466 | 5,283,600 | - | 190,026 | - | - | **13,915,370** |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | - | - | **-** |
| **2018 දෙසැම්බර් 31 දිනට පිරිවැය** | **1,991,278** | **-** | **9,179,997** | **5,283,600** | **-** | **190,026** | **-** | **-** | **16,644,901** |
| **2018 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය** | **-** | **-** | **68,238** | **-** | **-** | **-** | **-** | **-** | **68,238** |
| ක්ෂය වීම | 32,432 | - | 489,231 | 568,092 | - | 4,165 | - | - | **1,093,920** |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | - | - | **-** |
| **2018 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය** | **32,432** | **-** | **557,469** | **568,092** | **-** | **4,165** | **-** | **-** | **1,162,158** |
| **2018 ජනවාරි 01 දිනට ලියා හළ අගය** | **-** | **-** | **2,661,292** | **-** | **-** | **-** | **-** | **-** | **2,661,292** |
| **2018 දෙසැම්බර් 31 දිනට ලියා හළ අගය** | **1,958,846** | **-** | **8,622,528** | **4,715,508** | **-** | **185,861** | **-** | **-** | **15,482,742** |

**අධිකාරිය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් රු. 3, 415, 071.00 ක වටිනාකමින් යුතු ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ ද, රු. 4,651,600.00 ක වටිනාකමින් යුතු පරිගණක හා උපාංග ද මිල දී ගෙන ඇත.**

| සටහන 12<br>**වෙනත් බැරකම්** | **2018**<br>රු | **2017**<br>රු |
|---|---|---|
| උපචිත වියදම්- අනෙකුත් දීමනා | 100,000.00 | - |
| උපචිත වියදම් - අතිකාල | 65,198 | - |
| උපචිත වියදම් - ගමන් - දේශීය | 10,400 | - |
| උපචිත වියදම් - ඉන්ධන | 5,000 | - |
| උපචිත වියදම් - විදුලි සංදේශ | 55,756 | - |
| උපචිත වියදම් - නිවාඩු දින ගෙවීම් | 3,441 | - |
| උපචිත වියදම් - වැටුප් හා වේතන | 6,719 | - |
| **එකතුව** | **246,514** | **-** |

| සටහන **13**<br>**ජංගම නොවන බැරකම් /වගකීම්** | **2018**<br>රු | **2017**<br>රු |
|---|---|---|
| ගෙවීමට ඇති පාරිතෝෂිත (සටහන 13 (1)) | 440,404 | - |
| **එකතුව** | **440,404** | **-** |

| සටහන **13(1)**<br>**පාරිතෝෂිතය** | **2018**<br>රු | **2017**<br>රු |
|---|---|---|
| වර්ෂාරම්භක ශේෂය | - | - |
| වර්ෂය සඳහා වන අයකිරීම් | 440,404 | - |
| වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂිත මුදල | | - |
| **එකතුව** | 440,404 | - |

| **සටහන 14**<br>**සමුච්චිත අරමුදල** | **2018**<br>රු | **2017**<br>රු |
|---|---|---|
| ආරම්භක ශේෂය | - | - |
| වර්ෂය සඳහා වන අතිරික්ත /හිඟ | 487,801 | - |
| **එකතුව** | **487,801** | **-** |

| **සටහන 15**<br>**අධිකාරි ආරක්ෂක අරමුදල** | **2018**<br>රු | **2017**<br>රු |
|---|---|---|
| ආරම්භක ශේෂය | - | - |
| වර්ෂය තුළ වන මාරු කිරීම් | 555,800 | - |
| **එකතුව** | **555,800** | **-** |

| සටහන් 16<br>රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන් | 2018<br>රු | 2017<br>රු |
|---|---|---|
| ආරම්භක ශේෂය | 2,661,292 | - |
| වර්ෂය තුළ ලැබීම් | 11,212,000 | 2,729,531 |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | (2,082,393) | - |
| වර්ෂය තුළ විලම්භිත | (3,650,932) | (68,238) |
| **එකතුව** | **8,139,968** | **2,661,292** |

| සටහන 17<br>එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ප්‍රාග්ධන ප්‍රදානයන් | 2018<br>රු | 2017<br>රු |
|---|---|---|
| ආරම්භක ශේෂය | - | - |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ලද ස්ථාවර වත්කම් ප්‍රදානයක් - වර්ෂය තුළ ලැබීම් | 8,066,671 | - |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ලද ප්‍රාග්ධන ප්‍රදානයන් - වර්ෂය තුළ ලැබීම් | 21,660,500 | |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | (2,955,102) | - |
| වර්ෂය තුළ විලම්භිත | (19,429,295) | - |
| **එකතුව** | **7,342,774** | **-** |

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය**

**2018 දෙසැම්බර් 31 දින අවසන් වූ වර්ෂය සඳහා අධිකාරි ආරක්ෂණ අරමුදලේ ආදායම් වියදම් ප්‍රකාශනය**

| විස්තරය | එකතුව<br>රු |
|---|---|
| <u>අධිකරණයෙන් ලද අදායම</u><br><br>දඩ මුදල් එකතුව | 555,800 |
| **මුළු එකතුව (අ)** | **555,800** |
| **එකතු කළා : පොලී ආදායම** | - |
| **මුළු පොලිය (ආ)** | **-** |
| **අඩු කළා: වියදම්** | - |
| **මුළු වියදම ( ඇ )** | **-** |
| | |
| **ශුද්ධ ඉතිරිය (අ) + (ආ) + ( ඇ )** | **555,800** |

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය**

**එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සඳහා වන වියදම් වාර්තාව**

**කාල සීමාව : 2018.01.01 සිට 2018.12.31 දක්වා**

| **වාර්ෂික ඉලක්ක ඇතුළුව අපේක්ෂිත ප්‍රථිපල සහ දර්ශකයන්** | **සැලසුම් ගත ක්‍රියාකාරකම්** ප්‍රකාශිත ප්‍රථිපල ලබා ගැනීම සඳහා වසර පුරාවට සිදු කළ ක්‍රියාකාරකම් ලැයිස්තුව | සැලසුම් ගත අයවැය - **2018** | | **ගෙවීම් හා වියදම් (රු)** | | | |
|---|---|---|---|---|---|---|---|
| | | අයවැය විස්තරය | ගණන | මුදලින් කළ ගෙවීම් | ස්ථාවර වත්කම් වලින් කළ ගෙවීම් | වියදම් | ඉතිරි මුදල |
| | <u>පවත්වන ලද වැඩසටහන්</u> | | (රු) | (රු) | (රු) | (රු) | (රු) |
| | අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහාය සහ ආරක්ෂක කොට්ඨාසයේ නිලධරයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (අදාළ පනතේ 13 (ඔ) වගන්තිය | | 1,531,000 | 765,000 | - | - | 765,000 |
| | අදාළ නීතිය බලාත්මක කිරීමට සම්බන්ධ වන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය, පොලිස්පති, නීතිපති දෙපර්තමේන්තුව,අධිකරණ වෛද්‍ය නිලධාරීන්,ශ්‍රී ලංකා නීතිඥවරුනගේ සංගමය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශය, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය, අධිකරණ අමාත්‍යංශය, නීති ආධාර කොමිෂන් සභාව යන ආයතන වලට අදාළ නිලධාරින් සහ අධිකරණ වෛද්‍ය නිලධාරීන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (අදාළ පනතේ 13 (ඔ) වගන්තිය) | | 11,791,000 | 3,895,000 | - | 10,029,359 | 6,133,859 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සඳහා ආරක්ෂාව ඉල්ලා සිටීමේ ක්‍රියාපටිපාටිය සහ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සතු අයිතීන් සහ හිමිකම් සම්බන්ධයෙන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා පුළුල් සහ නව්‍ය ආකාරයේ මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (අදාළ පනතේ 13 (ඔ) වගන්තිය) | | 11,595,000 | 5,000,000 | - | 8,676,039 | 3,676,039 |
| | ජාතික අධිකාරියට අවශ්‍ය වන උපකරණ සපයාදීම, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් විසින් කෙරෙන ඉල්ලීම් සහ පැමිණිලි සම්බන්ධ ප්‍රගතිය ගණනය කිරීම උදෙසා ස්වයංක්‍රීය සිද්ධි කළමනාකරණ දත්ත ගබඩාවක් සකස් කිරීම, ජාතික අධිකාරිය සඳහා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධ පුස්තකාලයක් සහ පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම | | 15,083,000 | 12,000,000 | - | - | 12,000,000 |
| | අධිකාරිය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් මිල දී ගනු ලැබූ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | | | | 8,066,671 | 8,066,671 | |
| | **මුළු ගණන** | | **40,000,000** | **21,660,500** | **8,066,671** | **26,772,069** | **2,955,102** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JPA/B/NAPVCW/FA/01/18/48(i)

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019 ජුනි 21 දින

අධ්‍යක්ෂ ජනරාල්

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

සමාලෝචිත වර්ෂයේ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ මුද්‍රිත හා විද්‍යුත් සන්නිවේදන මෙවලම් සැකසීමේ කාර්යන් සඳහා අධිකාරිය විසින් සැලසිනේ ටෙලිවිෂන් ඉන්ස්ටියුට් ආයතනය සමඟ ඇතිකරගෙන තිබුණු ගිවිසුම ප්‍රකාරව ගෙවා තිබුණු අත්තිකාරම් මුදල වූ රු.8,676,039 ක් අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල නොදක්වා සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.8,676,039 අඩුවෙන් මූල්‍ය ප්‍රකාශවල දැක්වුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන

වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | **විස්තරය** |
|---|---|
| අධිකාරිය හා සැලසිනේ ටෙලිවිෂන් ඉන්ස්ටියුට් ආයතනය සමඟ 2018 නොවැම්බර් 28 දින ඇති කර ගන්නා ලද වැඩ හා සේවා ගිවිසුම 5 වන වගන්තිය | මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන - 2018 ට අදාලව මුද්‍රිත හා විද්‍යුත් සන්නිවේදන මෙවලම් සැකසීමේ කාර්යන් සඳහා වූ ගිවිසුම් ප්‍රකාරව නිර්මාණ භාර ගැනීමට පෙර මුළු මුදල වූ රු. 8,676,039 ගෙවා තිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

  සමාලෝචිත වර්ෂය සඳහා අනුමත ප්‍රසම්පාදන සැලැස්මේ වායු සමීකරණ යන්ත්‍ර 05 ක් මිලදී ගැනීමට සැලසුම සකස් කර තිබුණ ද එකී සැලැස්මෙන් බැහැරව වායු සමීකරණ යන්ත්‍ර 06 ක් රු, 540,000 කට මිල දී ගෙන තිබූ අතර තවත් යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේ දී එක් වායු සමීකරණ යන්ත්‍රයක් රු. 310,000 බැගින් වන ලෙස ඇස්තමේන්තු සකස් කර තිබුණද මිල කැඳවීමේ දී සියළුම ආයතන විසින් රු. 100,000 කට වඩා අඩු මිල ගනන් ඉදිරිපත් කර තිබූ අතර

අධිකාරිය ඇස්තමේන්තු සකස් කිරීමේ දී අධිතාත්වික ඇස්තමේන්තු සකස් කිරීම නිසා අය වැය ඵලදායී ලෙස උපයෝජනය කර නොතිබුණි. වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගැනීමේ දී පිරිවිතර නිසියාකාරව සකස් නොකිරීම නිසා මිලට ගැනුම් පිරිවැයට අමතරව සවිකරීම් සඳහා රු. 105,050 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) 2018 වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා අධිකාරියේ කාර්යසාධන වාර්තාවට අනුව නිති හා නීති බලාත්මක කිරීමේ අංශය වෙත මහජනතාව හා රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද සමස්ථ පැමිණිලි සංඛ්‍යාව 86 ක් විය. සමාලෝචිත වර්ෂයේ අධිකාරිය විසින් විමර්ශනය අවසන් කර වසා දැමූ පැමිණිලි සංඛ්‍යාව 23 ක් වන අතර විමර්ශනයන් සිදු කරමින් පවතින පැමිණිලි සංඛ්‍යාව 38 ක් විය. වසා දමා හෝ වෙනත් ආයතන වලට යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව 19 ක් වූ අතර ආරක්ෂාව සපයමින් පැවැති පැමිණිලි 5 ක් හා බහා තැබූ පැමිණිලි 4 ක්ද විය. අධිකාරිය මෙතෙක් ආරක්ෂක අංශයක් හෝ සහායක අංශයක් ස්ථාපිත කර නොතිබුණ හෙයින් " ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ සහායක හා ආරක්ෂක කොට්ඨාසය " වෙත අධිකාරිය වෙත ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් 30 ක් එනම් සියයට 35 ක ප්‍රතිශතයක් යොමු කර තිබුණි.

(ආ) අධිකාරිය දැනට පවත්වාගෙන යන ගොඩනැගිල්ල අධිකරණ අමාත්‍යාංශය සතුව පැවති අතර එහි විදුලිය, ජලය වැනි නඩත්තු වියදම් අධිකරණ අමාත්‍යාංශය යටතේ දරනු ලබයි. විධිමත් පරිදි අධිකාරිය වෙත පැවරීමක් සිදු කර නොමැති ගොඩනැගිල්ලේ කාර්යාල පරිශ්‍රය සකස් කිරීමේ දී අභ්‍යන්තර වෙන් කිරීම් (Partition) සඳහා රු. 1,991,278 ක මුදලක් අධිකාරිය විසින් වියදම් කර තිබුණි. මෙකී ප්‍රාග්ධන වියදම මඟින් ලැබිය යුතු ප්‍රතිලාභ අධිකාරියට ලබා ගත හැකි වන පරිදි විධිමත් තහවුරුවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන (UNDP) ව්‍යාපෘතිය යටතේ අධිකාරිය වෙත ලැබී තිබුණ එකතු වටිනාකම රු.410,363 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රය සහ මුද්‍රණ යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(ඇ) අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 54ක් වූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ පැවති තනතුරු සංඛ්‍යාව 31ක් විය. ආයතනයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සෘජුවම බලපාන තනතුරු 23 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් තවදුරටත් පුරප්පාඩුව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති